# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 1,981 - 2016 අගෝස්තු මස 19 වැනි සිකුරාදා - 2016.08.19**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස : (IIආ) වැනි ඡෙදය - පළකිරීම්

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)

| | පිටුව |
|---|---|
| ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම් .... ... ... | — |
| තීරණය කළ ටෙන්ඩර් පත් පිළිබඳ දැන්වීම් ... ... ... | — |
| බඩු බාහිරාදිය විකිණීම් ... ... ... | 1576 |
| තොටුපල් රේන්ද හා වෙනත් රේන්ද විකිණීම් ... ... ... | 1578 |
| රජයේ නොවන දැන්වීම් ... ... ... | 1583 |
| රට බීම විකිණීමේ බලපත්‍රය සඳහා වූ අයදුම්පත් ... ... | 1589 |
| වෙන්දේසි කිරීම් පිළිබඳ දැන්වීම් ... ... ... | 1594 |

*සැ. යු.* - සිසිර ජයකොඩි සියපත පදනම (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත 2016 ජුනි මස 03 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

## වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට **තෙමසකට** පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2016 සැප්තැම්බර් මස 09 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2016 අගෝස්තු මස 26 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනැවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගණුදෙනු පනත - 9 වැනි වගන්තිය**

*" යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළකළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළකරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණකර ඇත්තාක් සේ සැලකිය යුතුය."*

**බී. කේ. එස්. රවීන්ද්‍ර,**
රජයේ මුද්‍රණාලයාධිපති *(වැ. බ.)*.

2016 ජුනි මස 21 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

*මෙම ගැසට් පත්‍රය www. documents.gov. lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

1575 - B 81089 - 5,403 (2016/08)

# බඩු බාහිරාදිය විකිණීම්

## දිසා/මහෙස්ත්‍රාත් අධිකරණය -මොණරාගල

### අධිකරණය වෙත ඉදිරිපත් කරන ලද රාජසන්තක කරනු ලැබූ හා හිමිකම් නොපාන ලද භාණ්ඩ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

මොණරාගල දිසා/මහේස්ත්‍රාත් අධිකරණයේ නඩුවලට අදාළව රාජසන්තක කරනු ලැබූ හිමිකම් නොපාන ලද පහත සඳහන් භාණ්ඩ 2016.09.10 වැනි සෙනසුරාදා පෙ.ව.9.30ට මෙම අධිකරණ භූමියේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

02. මෙහි පහත සඳහන් භාණ්ඩවලට හිමිකම් පාන්නකු වේ නම් වෙන්දේසිය පැවැත්වීමට නියමිත දිනට පෙර ස්වකීය හිමිකම් අධිකරණයේ රෙජිස්ට්‍රාර් වෙත ඉදිරිපත් කළ යුතුය.

03. රෙජිස්ට්‍රාර්වරයාගේ අවසරය ඇතිව වෙන්දේසියට පැය භාගයකට පෙර විකිණීමට නියමිත භාණ්ඩ මහජනයාට පරීක්ෂා කර බැලිය හැක.

04. අධිකරණය මගින් නියම කරනු ලබන අවම ලංසුව නොපිළිගන්නා අවස්ථාවල දී අධිකරණයේ අභිමතය පරිදි එම ද්‍රව්‍ය වෙන්දේසියෙන් ඉවත් කර ගැනීමේ අයිතිය අධිකරණය සතුව පවතී.

05. වෙන්දේසියේදී මිල දී ගනු ලබන ද්‍රව්‍යයන් එවේලේම මුදල් ගෙවා අධිකරණ භූමියෙන් ඉවත් කර ගත යුතුය.

06. වෙන්දේසියේ භාණ්ඩ මිලදී ගන්නා ගැණුම්කරුවන් විසින් තමන්ගේ අනන්‍යතාවය තහවුරු කිරීම සඳහා ජාතික හැඳුනුම්පත ඉදිරිපත් කළ යුතුය.

එස්. එස්. එන්. ගමගේ,
දිසා විනිසුරු හා මහේස්ත්‍රාත් ,
මොණරාගල.

2016 ජූලි මස 28 වැනි දින,
මොණරාගල දිසා/මහේස්ත්‍රාත් අධිකරණයේ දී ය.

### වෙන්දේසියට අදාළ භාණ්ඩ ලැයිස්තුව

මහේස්ත්‍රාත් අධිකරණය -මොණරාගල

| අනු. අංකය | නඩු අංකය | නඩු භාණ්ඩය |
|---|---|---|
| 01 | 71894 | අංක 122-8874 දරන වර්ගය හඳුනා ගැනීමට නොහැකි යතුරු පැදි 01 යි |
| 02 | 72580 | අංක මැකී ඇති අත්ට්‍රැක්ටරය හා ට්‍රේලරය (අමතර කොටස් සඳහා පමණි) |
| 03 | 78163 | සෙන්පින් වර්ගයේ අංක මැකී ඇති අත්ට්‍රැක්ටරය හා ට්‍රේලරය(අමතර කොටස් සඳහා පමණි) |
| 04 | 74264 | අංක මැකී ඇති අත්ට්‍රැක්ටරයේ මැෂිම පමණි. (අමතර කොටස් සඳහා පමණි) |
| 05 | 77235 | සී පැන් වර්ගයේ අංක මැකී ඇති අත් ට්‍රැක්ටරය (අමතර කොටස් සඳහා පමණි) |
| 06 | 60285 | අංක EPSG 8819 දරන සෙන්පින් වර්ගයේ අත්ට්‍රැක්ටරය හා ට්‍රේලරය (අමතර කොටස් සඳහා පමණි) |
| 07 | 58088 | අංක UPSF 1178 දරන ඇග්‍රෝ වර්ගයේ අත්ට්‍රැක්ටරය හා ට්‍රේලරය (අමතර කොටස් සඳහා පමණි) |
| 08 | 69310 | අංක UPSJ 9038 දරන සී පැන් වර්ගයේ අත්ට්‍රැක්ටරය හා ට්‍රේලරය (අමතර කොටස් සඳහා පමණි) |
| 09 | 55789 | අංක UPHD 5425 දරන අත්ට්‍රැක්ටරය හා ට්‍රේලරය (අමතර කොටස් සඳහා පමණි) |
| 10 | 65328 | අංක රහිත මහ ට්‍රැක්ටර් ට්‍රේලරය (අමතර කොටස් සඳහා පමණි) |
| 11 | AR 413/10 | අංක V.C 113103 දරන පාපැදි 01 යි. |
| 12 | AR 819/15 | අංක P438519 දරන පාපැදි 01 යි. |
| 13 | AR 594/08 | පාපැදි 01 යි. |
| 14 | NS 19/06 | AX 20917 දරන පාපැදි 01 යි. |
| 15 | BR 114/07 | පාපැදි 02 යි. |
| 16 | BR 113/07 | ලූමාලා වර්ගයේ පාපැදි 01 යි |
| 17 | AR 773/15 | අංක 8009 දරන පාපැදි 01 යි |
| 18 | AR 1053/11 | අංක 3-90 දරන පාපැදි 01 යි |
| 19 | 77795 | යකඩ බාල්දි 01 යි |
| 20 | 69659 | බාල්දි 01 යි |
| 21 | 74517 | සවල් 01 යි, යකඩ බාල්දි 01 යි, ප්ලාස්ටික් බාල්දි 01 යි |
| 22 | 79296 | සවල් 01 යි |
| 23 | 79270 | සවල් 01 යි |
| 24 | 77482 | යකඩ බාල්දි 01 යි |
| 25 | 65032 | ග්‍රිල් 01 යි |
| 26 | 59856 | තණකොළ කපන මැෂින් 01 යි |

| අනු. අංකය | නඩු අංකය | නඩු භාණ්ඩය |
|---|---|---|
| 27 | 57544 | ඉල්ලම් කුරු 01 යි |
| 28 | 70339 | කැති 01 යි |
| 29 | 69315 | කැති 01 යි |
| 30 | 79051 | සවල් 01 යි |
| 31 | 77901 | උදලු 01 යි |
| 32 | 53416 | උදලු 01 යි |
| 33 | 45938 | උදලු 02 යි |
| 34 | 69458 | උදලු 01 යි |
| 35 | 43284 | උදලු 01 යි |
| 36 | 43262 | මිට සහිත උදලු 01 යි |
| 37 | 79244 | උදලු 01 යි |
| 38 | 79177 | උදලු 01 යි |
| 39 | 78654 | උදලු 01 යි |
| 40 | 78544 | සවල් 02 යි, බාල්දි 02 යි |
| 41 | 75580 | උදලු 01 යි |
| 42 | 78285 | යකඩ බාල්දි 02 යි, යකඩ සවල් 02 යි |
| 43 | 78450 | ඇඳුම් උදලු 01 යි |
| 44 | 75578 | උදලු 01 යි |
| 45 | 78743 | ලී තද කරන කරාම 01 යි, දඬු අඬු 01 යි, අත් කියත් 01 යි, යතු කැට 01 යි. |
| 46 | 69244 | උදලු 01 යි |
| 47 | 79088 | උදලු 01 යි |
| 48 | 63151 | මිට සහිත පොරොව 01 යි |
| 49 | 39694 | මිට සහිත කැති 01 යි |
| 50 | 52416 | මිට සහිත කැති 01 යි |
| 51 | 39520 | මිට සහිත කැති 01 යි |
| 52 | 40992 | මිට සහිත කැති 01 යි |
| 53 | 64032 | මිට සහිත කැති 01 යි |
| 54 | 58487 | මිට සහිත කැති 01 යි |
| 55 | 65823 | මිට සහිත කැති 01 යි |
| 56 | 33315 | මිට සහිත කැති 01 යි |
| 57 | 33313 | මිට සහිත කැති 01 යි |
| 58 | 33312 | මිට සහිත කැති 01 යි |
| 59 | 33805 | මිට සහිත කැති 01 යි |
| 60 | 33803 | මිට සහිත කැති 01 යි |
| 61 | 33808 | මිට සහිත කැති 01 යි |
| 62 | 38164 | මිට සහිත කැති 01 යි |
| 63 | 33311 | මිට සහිත කැති 01 යි |
| 64 | 38201 | මිට සහිත කැති 01 යි |
| 65 | 58484 | මිට සහිත කැති 01 යි |
| 66 | 34332 | මිට සහිත කැති 01 යි |
| 67 | 33804 | මිට සහිත කැති 01 යි |
| 68 | 38708 | මිට සහිත කැති 01 යි |
| 69 | 37889 | මිට සහිත කැති 01 යි |
| 70 | 39491 | මිට සහිත කැති 01 යි |
| 71 | 39489 | මිට සහිත කැති 01 යි |
| 72 | 94667 | මිට සහිත කැති 01 යි |
| 73 | 37749 | මිට සහිත කැති 01 යි |
| 74 | 51096 | මිට සහිත කැති 01 යි |
| 75 | 33317 | මිට සහිත කැති 01 යි |
| 76 | 34101 | මිට සහිත කැති 01 යි |
| 77 | 33807 | මිට සහිත කැති 01 යි |
| 78 | AR429/16 | මිට සහිත සවල් 02 යි, යකඩ බාල්දි 02 යි |
| 79 | 78862 | විදුලි පන්දම් 02 යි, පිහි 01 යි |
| 80 | 78838 | සවල් 01 යි |
| 81 | 78837 | සවල් 01 යි |
| 82 | 74354 | ඇලුමිනියම් තාච්චි 01 යි |
| 83 | 54287 | උදලු 01 යි |
| 84 | 67404 | උදලු 01 යි |
| 85 | 69312 | උදලු 01 යි |
| 86 | 64631 | උදලු 01 යි |
| 87 | 49028 | කැති 01 යි |
| 88 | 66138 | උදලු 01 යි |
| 89 | 58137 | අලවංගු 01 යි, උදලු 01 යි, පිකස් 01 යි, කුලු ගෙඩි 01 යි, ඉල්ලම් කුරු 01 යි |
| 90 | 52574 | කුලු ගෙඩි 01 යි, ඉල්ලම් කුරු 01 යි |
| 91 | 72099 | සවල් 02 යි, උදලු 01 යි |
| 92 | BR 858/14 | අලවංගු 01 යි |
| 93 | 71653 | උදලු 01 යි, බයට් 01 යි |
| 94 | 77839 | ඉල්ලුම් කුරු 01 යි |
| 95 | 79087 | උදලු 01 යි |
| 96 | 77719 | ඉල්ලම් කුරු 01 යි |
| 97 | 77548 | පොරෝ 01 යි |
| 98 | 59850 | ඉල්ලම් කුරු 01 යි |
| 99 | 77276 | ඉල්ලම් කුරු 01 යි |
| 100 | 78823 | උදලු 01 යි |
| 101 | 68936 | අලවංගු 01 යි |
| 102 | 79369 | සවල් 01 යි |
| 103 | 76361 | සවල් 01 යි, බාල්දි 01 යි |
| 104 | 55230 | ග්‍රිල් 01 යි |

08-405

# තොටුපල් රේන්ද හා වෙනත් රේන්ද විකිණීම්

## කටාන ප්‍රාදේශීය ලේකම් කාර්යාලය

### 2017 වර්ෂය සඳහා රා තැබෑරුම් රේන්ද විකිණීම

2017 ජනවාරි මස 01 වැනි දින සිට 2017 දෙසැම්බර් මස 31 වැනි දින දක්වා කාලය තුළ පහත සඳහන් උපලේඛනයෙහි දක්වා ඇති, කටාන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ රා තැබෑරුම්වල පැසුණු රා සිල්ලරට විකිණීමේ සම්පූර්ණ වරප්‍රසාද මිල දී ගැනීම සඳහා 1982 අගෝස්තු මස 20 වැනි දින, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 207 දරන *ගැසට් පත්‍රයේ* පළ කරන ලද රා විකිණීමේ කොන්දේසිවලට ද, දැනට බල පවත්නා සියලුම සුරාබදු කොන්දේසිවලට හා පහත සඳහන් කොන්දේසිවලට ද යටත් ව 2016.09.22 වැනි දින පෙ.ව. 10.30 දක්වා ම විසින් ටෙන්ඩර් පත් භාරගනු ලැබේ.

02. රා රේන්ද ලබාගැනීමට ඉදිරිපත්වන අය, ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකින් ලබාගත හැකි නියමිත ටෙන්ඩර් ආකෘති පත්‍රයක් නිසියාකාරව සම්පූර්ණ කර මෙහි පහත උපලේඛනයෙහි දක්වා ඇති අනුමත රා තැබෑරුම් ලැයිස්තුවෙන් නියම කර ඇති ටෙන්ඩර් මුදල ගෙවා, ලබාගත් ප්‍රාදේශීය ලේකම් කාර්යාල කුවිතාන්සියක් ද, ප්‍රකාශිත රේන්ද කොන්දේසි පරිදි ලබාගත් වත්කම් සහතිකයක් ද (අදාළ ටෙන්ඩරයේ සඳහන් යටත් පිරිසෙයින් 15% කට ලබාගත් වටිනාකම් සහතිකයක්) සහිතව මුද්‍රා තබන ලද කවරයක බහා, එහි මුදුනේ වම් කෙළවරේ තමන් ටෙන්ඩර් කරනු ලබන ''තැබෑරුමේ අංකය හා නම ද'' පැහැදිලිව ලියා, ඒ ඒ තැබෑරුම් සඳහා මෙහි දැක්වෙන ටෙන්ඩර් භාරගැනීමේ අවසාන වේලාවට පෙර ලියාපදිංචි කරන ලද තැපෑලෙන් හෝ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ තිබෙන ටෙන්ඩර් පෙට්ටියේ තැන්පත් කිරීමෙන්, කටාන ප්‍රාදේශීය ලේකම් වෙත ලැබෙන්නට සැලැස්විය යුතු ය.

03. ටෙන්ඩර්කරුවන් විසින් ටෙන්ඩර්පත් සම්පූර්ණ කිරීමේ දී ටෙන්ඩර් පත්‍රවල කරනු ලබන සෑම වෙනස් කිරීමක් ම ටෙන්ඩර්කරුගේ සම්පූර්ණ අත්සන යෙදීමෙන් සනාථ කළ යුතු ය. එසේ නොවන ටෙන්ඩර්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

04. ටෙන්ඩර් පත්‍ර භාර ගන්නා අවසාන දිනය වන 2016.09.22 වැනි දින පෙ.ව. 10.30 ට සියලුම ටෙන්ඩර්කරුවන් මෙම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ පෙනී සිටිය යුතු ය.

05. කිසියම් කරුණක් සටහන් නොකොට ඇති ටෙන්ඩර් පත්‍රිකාවක් හෝ ටෙන්ඩර් පත්‍ර සියල්ලම ප්‍රතික්ෂේප කිරීමේ අයිතිය කටාන ප්‍රාදේශීය ලේකම් සතු වේ.

06. පූර්වෝක්ත දින විකිණීමට නොහැකි වූ රා තැබෑරුම් නැවත විකිණීම 2016.11.17 දින පෙ.ව. 10.30 ට සිදුකරනු ලැබේ. එදින ටෙන්ඩර් ඉදිරිපත් කිරීම මෙම *ගැසට් නිවේදනයේ* සඳහන් අවශ්‍යතාවයන් ට අනුකූල විය යුතු ය.

07. තනි වරප්‍රසාද මිල දී ගත් තැනැත්තා යැයි ප්‍රකාශයට පත්කිරීමෙන් අනතුරුව එසේ ප්‍රකාශ කළ දින, එනම් රේන්ද විකුණූ දින ප.ව. 2.00ට පෙර කටාන ප්‍රාදේශීය ලේකම් විසින් නියම කරනු ලබන මුදල වන මාස දෙකක රේන්ද මුදල් කොටසට වැඩි මුදලක් ඇප තැන්පත් වශයෙන් ගෙවා තැබෑරුම් පිළිබඳ කොන්දේසිවලට අත්සන් කළ යුතු ය.

08. ටෙන්ඩර් ඉදිරිපත් කිරීමේ දී දැනගත යුතු වෙනත් විස්තර ඇත්නම් ඒවා කටාන ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් ලබාගත හැකි ය.

කේ. ජී. එච්. එච්. ආර්. කිරිඇල්ල,
ප්‍රාදේශීය ලේකම්,
කටාන.

2016 අගෝස්තු මස 03 වැනි දින,
කටාන ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

**උපලේඛනය - 2017**

| *අනුක්‍රමික අංකය* | *තැබෑරුමේ නම සහ අංකය* | *කොට්ඨාසය* | *තැබෑරුම පිහිටුවිය යුතු ප්‍රාදේශීය කොට්ඨාසය* | *තැබෑරුම විවෘත කරන වේලාව* | *තැබෑරුම වසන වේලාව* | *ටෙන්ඩර් තැන්පත් මුදල රු.* | *ටෙන්ඩර් භාර ගැනීමේ අවසාන දිනය හා වේලාව* |
|---|---|---|---|---|---|---|---|
| 01. | මුකලන්ගමුව අංක 13 | කටාන | මුකලන්ගමුව ගමේ පමණක් | පෙ.ව. 11.00<br>ප.ව. 5.00 | ප.ව. 2.00<br>ප.ව. 8.00 | 4,000 | 2016.09.22<br>පෙ.ව. 10.30 |

| අනුක්‍රමික අංකය | තැබෑරුමේ නම සහ අංකය | කොට්ඨාසය | තැබෑරුම පිහිටුවිය යුතු ප්‍රාදේශීය කොට්ඨාසය | තැබෑරුම විවෘත කරන වේලාව | තැබෑරුම වසන වේලාව | ටෙන්ඩර් තැන්පත් මුදල රු. | ටෙන්ඩර් භාර ගැනීමේ අවසාන දිනය හා වේලාව |
|---|---|---|---|---|---|---|---|
| 02 | කටුනායක අංක 14 | කටාන | කටුනායක ගමේ පමණක් | පෙ. ව. 11.00 ප.ව. 5.00 | ප.ව. 2.00 ප.ව. 8.00 | 4,000 | 2016.09.22 පෙ.ව. 10.30 |
| 03 | ඇත්ගාල අංක 13 | කටාන | ඇත්ගාල ගමේ පමණක් | පෙ.ව. 11.00 ප.ව. 5.00 | ප.ව. 2.00 ප.ව. 8.00 | 500 | 2016.09.22 පෙ.ව. 10.30 |
| 04 | නැ/කටාන අංක 24 | කටාන | නැ/කටාන ගමේ පමණක් | පෙ.ව. 11.00 ප.ව. 5.00 | ප.ව. 2.00 ප.ව. 8.00 | 2,000 | 2016.09.22 පෙ.ව. 10.30 |
| 05 | දෙමන්හන්දිය අංක 27 | කටාන | දෙමන්හන්දිය ගමේ පමණක් | පෙ.ව. 11.00 ප.ව. 5.00 | ප.ව. 2.00 ප.ව. 8.00 | 2,000 | 2016.09.22 පෙ.ව. 10.30 |
| 06. | බම්බුකුලිය අංක 26 | කටාන | බම්බුකුලිය ගමේ පමණක් | පෙ.ව. 11.00 ප.ව. 5.00 | ප.ව. 2.00 ප.ව. 8.00 | 1,000 | 2016.09.22 පෙ.ව. 10.30 |

08-524

---

## උඩුබද්දාව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ රා තැබෑරුම් රේන්ද විකිණීම - 2017 වර්ෂය

2017 ජනවාරි මස 01 දා සිට 2017 දෙසැම්බර් මස 31 දක්වා වූ කාලය තුළ පහත සඳහන් උපලේඛනයෙහි දක්වා ඇති රා තැබෑරුමේ පැසුණු රා සිල්ලරට විකිණීමේ සම්පූර්ණ වරප්‍රසාදය මිල දී ගැනීම සඳහා 1982 අගෝස්තු මස 20 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 207 දරන ගැසට් පත්‍රයේ සුරාබදු කොමසාරිස්වරයා විසින් පළකරන ලද රා විකිණීමේ කොන්දේසිවලට ද දැනට පවත්නා සියලු සුරාබදු කොන්දේසිවලට ද යටත්ව 2016 සැප්තැම්බර් මස 02 වැනි දින පෙ. ව. 10.30 දක්වා උඩුබද්දාව ප්‍රාදේශීය ලේකම් විසින් ටෙන්ඩර් පත් භාරගනු ලැබේ.

02. රා රේන්ද මිල දී ගැනීමට ඉදිරිපත්වන අය ඕනෑම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකින් ලබා ගත හැකි නියමිත ටෙන්ඩර් ආකෘති පත්‍රයක් නිසි පරිදි සම්පූර්ණ කොට මෙහි පහත දැක්වෙන උපලේඛනයෙහි නියම කොට ඇති ටෙන්ඩර් තැන්පත් මුදල ඕනෑම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයක සරප්ගෙන් ලත් මුදල් කුවිතාන්සියක් ද ඉහත දක්වා ඇති ගැසට් නිවේදනයේ වන රා විකිණීමේ කොන්දේසිවලට දැක්වෙන පරිදි ලබාගත් වත්කම් සහතිකයක් ද, සහිතව කවරයක බහා එයට උපලේඛනයේ දැක්වෙන අවසාන වේලාවට පෙර ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවීමෙන් හෝ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියේ තැන්පත් කිරීමෙන් උඩුබද්දාව ප්‍රාදේශීය ලේකම් වෙත ලැබෙන්නට සැලැස්විය හැක.

03. ටෙන්ඩර්කරුවන් විසින් ටෙන්ඩර්පත් සම්පූර්ණ කිරීමේ දී ටෙන්ඩර් පත්‍රවල කරන සෑම වෙනස් කිරීමක්ම ටෙන්ඩර්කරුගේ අත්සන යෙදීමෙන් සනාථ කළ යුතු ය. එසේ නොවන ටෙන්ඩර්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

04. ටෙන්ඩර් භාරගන්නා අවසාන දිනය වන 2016 සැප්තැම්බර් මස 02 වැනි දින පෙ. ව. 10.30 ට සියලුම ටෙන්ඩර්කරුවන් උඩුබද්දාව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ පෙනී සිටිය යුතු ය.

05. කිසියම් කරුණු දැක්වීමක් නොකොට ටෙන්ඩර් පත්‍රිකාවක් හෝ ටෙන්ඩර් පත්‍රිකා සියල්ල ප්‍රතික්ෂේප කිරීමේ අයිතිය උඩුබද්දාව ප්‍රාදේශීය ලේකම් සතු වේ.

06. "තනි වරප්‍රසාදය මිලදී ගත් තැනැත්තා" යැයි ප්‍රකාශයට පත් කිරීමෙන් පසුව සාර්ථක ටෙන්ඩර්කරු විසින් එසේ ප්‍රකාශ කළ දින ප. ව. 2.00 ට පෙර උඩුබද්දාව ප්‍රාදේශීය ලේකම් විසින් නියම කරනු ලබන මුදලක් ආරක්ෂිත ඇප තැන්පත් වශයෙන් ගෙවා විකුණුම් කොන්දේසිවලට අත්සන් කළ යුතු ය.

07. 2017 වර්ෂය සඳහා දැනට රා තැබෑරුම් ඇති ස්ථානය ලබා දීමට සහතික වනු නොලැබේ. දැනට රා තැබෑරුම පවත්වාගෙන යනු ලබන ගොඩනැගිල්ල 2017 වර්ෂය සඳහා නොලැබෙන්නේ නම් ඒ වෙනුවට තෝරාගත් අලුත් ස්ථානයේ යෝග්‍යතාවය පිළිබඳ ටෙන්ඩර් ප්‍රදානය කළ දින සිට දින 30ක් ඇතුළත සාර්ථක ටෙන්ඩර්කරු විසින් ඒ සඳහා උඩුබද්දාව ප්‍රාදේශීය ලේකම්ගෙන් අනුමැතිය ලබා ගත යුතු ය.

08. 2016 සැප්තැම්බර් මස 02 වැනි දින රේන්ද විකිණීමේ ලා සතුටුදායක ඉල්ලීම් නොතිබුණහොත් 2016 ඔක්තෝබර් මස 27 වැනි දින පෙ. ව. 10.30 ට නැවත රේන්ද විකිණීම මේ ස්ථානයේ දී පවත්වනු ලැබේ.

09. වැඩි විස්තර අවශ්‍යනම් මෙම උඩුබද්දාව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් ලබාගත හැකිය.

ඩී. ඒ. නයනානන්ද,
ප්‍රාදේශීය ලේකම්,
උඩුබද්දාව.

2016 අගෝස්තු මස 03 වැනි දින,
උඩුබද්දාව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

උපලේඛනය

**උඩුබද්දාව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ අනුමත රා තැබෑරුම - 2017 වර්ෂය**

| නම හා අංකය | පත්තුව | තැබෑරුම විවෘත කළ යුතු ප්‍රදේශය | ටෙන්ඩර් තැන්පත් මුදල රු. | ටෙන්ඩර් වසන දිනය සහ වේලාව | තැබෑරුම් විවෘත කළ යුතු වේලාව | තැබෑරුම් වැසිය යුතු වේලාව |
|---|---|---|---|---|---|---|
| උඩුබද්දාව අංක 02 | කටුගම්පල හත්පත්තුව | උඩුබද්දාව ගම තුළ | 1,000 | 2016.09.02 පෙ. ව. 10.30 | පෙ. ව. 11.00 සහ ප. ව. 5.00 | ප. ව. 2.00 සහ ප. ව. 8.00 |

08-521

---

**නැගෙනහිර නුවරගම් පළාත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය - අනුරාධපුර**

රා තැබෑරුම් රේන්ද විකිණීම - 2017 වර්ෂය

2017 වර්ෂයට පහත දැක්වෙන තැබෑරුමේ පැසුණු රා විකිණීම සඳහා ටෙන්ඩර්පත්‍ර පහත සඳහන් කොන්දේසිවලට යටත් ව භාරගනු ලැබේ :-

(i) 1982 අගෝස්තු මස 20 වැනි දින අංක 207 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ සඳහන් රා රේන්ද විකිණීමේ කොන්දේසි,

(ii) සියලු සුරාබදු නීතිය යටතේ දැනට බලපවත්වන සාමාන්‍ය කොන්දේසි.

02. මෙම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් ලබා ගන්නා ලද ටෙන්ඩර් ආකෘති පත්‍රයක ලියන ලද සෑම ටෙන්ඩර් පතක්ම රු. 2,000 ක මුදලක් ගෙවා නැගෙනහිර නුවරගම් පළාත ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාලයෙන් ලබාගත් කුවිතාන්සියක් සමග ඉදිරිපත් කළ යුතු ය.

03. සාර්ථක වූ ටෙන්ඩර්කරුවන් විසින් ඔහුගේ ටෙන්ඩර් පත්‍රය සමග ඔවුන්ට අයත් නිශ්චල දේපළවල වටිනාකම් සහතිකයක් ප්‍රාදේශීය මහලේකම් තැනගෙන් ලබාගෙන ඇමිණිය යුතු ය. එය තැබෑරුමට ඉල්ලුම් කරන ටෙන්ඩර් මුදලේ වටිනාකමින් සියයට පහළොවකට (15%) නොඅඩු සහතිකයක් විය යුතු ය. මෙම ඡේදයේ සඳහන්වන සහතිකයට අදාළ නිශ්චල දේපළ මෙකී රේන්ද කාලය තුළ දී විකිණීමට හෝ පැවරීමට තහනම් වන්නේ ය. මෙය කඩ කරන අයගේ ගිවිසුම අවලංගු වූවා සේ සැලකේ.

04. සෑම ටෙන්ඩර්පතක් ම සීල් තබන ලද කවරයක බහා එහි වම්පස ඉහළ කෙළවරේ ''2017 වර්ෂය සඳහා අනුරාධපුර නැගෙනහිර නුවරගම් පළාත රා තැබෑරුම සඳහා ටෙන්ඩර් පත්‍රය'' යනුවෙන් සඳහන් කර 2016 සැප්තැම්බර් මස 02 වැනි දින පෙරවරු 10.30 ට පෙර අනුරාධපුර නැගෙනහිර නුවරගම් පළාත ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියට දැමිය යුතු ය. ටෙන්ඩර් පත්‍ර තැපෑලෙන් එවන්නේ නම් ඒවා ලියාපදිංචි තැපෑලෙන් ඉහත සඳහන් පරිදි එවිය යුතු ය. 2016.09.02 වැනි දින පෙ. ව. 10.30 ට ටෙන්ඩරය විවෘත කරනු ලැබේ. ටෙන්ඩර් අයදුම්කරුවන් අදාළ දින නියමිත වේලාවට නැගෙනහිර නුවරගම් පළාත ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ පෙනී සිටිය යුතු ය.

05. සාර්ථක වූ ටෙන්ඩර්කරුට ඔහුගේ ටෙන්ඩර් පත්‍රය පිළිගත් බව දැන්වූ විට රේන්ද විකිණීමේ කොන්දේසිවලට අත්සන් කර ප්‍රාදේශීය ලේකම් විසින් ඇප තැන්පත් මුදල් වශයෙන් නියම කරනු ලබන මුදලින් ගෙවිය යුතු ය.

06. සාර්ථක වූ ටෙන්ඩර්කරුට ඔහුගේ ටෙන්ඩර් පත්‍රය පිළිගත් බව දැන් වූ විට රේන්ද විකිණීමේ කොන්දේසිවලට අත්සන් කිරීම හෝ නියම කළ ඇප මුදල් තැන්පත් කිරීම පැහැර හැරියහොත් හෝ ඔහු විසින් තැන්පත් කරන ලද ටෙන්ඩර් තැන්පත් මුදල අහිමි වූ බව ප්‍රකාශ කරනවාත් හැර එය පැහැර හරින්නාගේ නම සියලු සුරාබදු බලපත්‍රවලට අදාළ පැහැර හරින්නන්ගේ නාම ලේඛනයට ඇතුළත් කරනු ලැබේ. ජයග්‍රාහි ටෙන්ඩර්කරු විසින් රේන්ද විකිණීමේ කොන්දේසි අත්සන් තැබීමෙන් හා නියමිත ඇප මුදල තැන්පත් කිරීමෙන් පසු සියලුම ටෙන්ඩර්කරුවන්ගේ තැන්පත් මුදල ආපසු ගෙවනු ලැබේ.

07. ටෙන්ඩර් පත්‍රයක් හෝ සියලු ම ටෙන්ඩර්පත්‍ර කිසිම හේතුවක් නොදන්වා ප්‍රතික්ෂේප කිරීමේ අයිතිය ප්‍රාදේශීය ලේකම් වෙත පැවරී ඇත.

08. අනුමත කරන ලද තැබෑරුම් ලැයිස්තුව පහත දැක්වේ :-

| *අනු. අංකය* | *කොට්ඨාසය* | *තැබෑරුම පිහිටුවිය යුතු ප්‍රදේශය හා කොටස* | *තැබෑරුම විවෘත කරන වේලාව* |
|---|---|---|---|
| 01 | අනුරාධපුරය | අනුරාධපුර නව නගරයේ නගර සීමාව තුළ | පෙ. ව. 11.00 සිට ප. ව. 2.00 දක්වා<br>ප. ව. 5.00 සිට ප. ව. 8.00 දක්වා |

09. තනි බලයලත් පුද්ගලයා විසින් එහි අට (08) වැනි ඡේදයේ සඳහන් ප්‍රාදේශීය ලේකම් විසින් වෙන් කර දී ඇති ප්‍රාදේශීය පෙදෙසේ ගොඩනැගිල්ලක් සකස් කළ යුතු ය. සාර්ථක ටෙන්ඩර්කරු විසින් යෝජිත ස්ථානයක් සපයාගත යුතු ය. ප්‍රාදේශීය ලේකම්ගේ අනුමැතිය ලබාගෙන මිස තැබෑරුම වෙනත් ස්ථානයක විවෘත නොකළ යුතු අතර, එසේ කිරීමට ගතයුතු අනුමැතිය බලය ලැබීමේ අනුමැතිය ආරම්භවීමට දින 14 කට පෙර ප්‍රාදේශීය ලේකම්ගෙන් ලබාගත යුතු ය.

10. රා තැබෑරුම පවත්වාගෙන යන ගොඩනැගිල්ල කිසියම් රජයේ ආයතනයකට සංස්ථාවකට හෝ පළාත් පාලන ආයතනයකට අයත් වන විට රේන්දයට අදාළ සම්පූර්ණ කාලයට එම ගොඩනැගිල්ල වෙනුවෙන් අදාළ ආයතනයට බද්ද ගෙවා ඒ බැව් ගිවිසුමේ අත්සන් කිරීමට පෙර සනාථ කළ යුතු ය.

11. මේ සම්බන්ධයෙන් විස්තර නැගෙනහිර නුවරගම් පළාත ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් ලබාගත යුතු ය.

12. *වැදගත්* .- 2016.09.02 වැනි දින රා රේන්ද විකිණීමට නොහැකි වුවහොත් 2016.10.27 වැනි දින පෙරවරු 10.30 ට නැවත විකුණනු ලැබේ.

ජේ. ඩබ්. එස්. කිත්සිරි,
ප්‍රාදේශීය ලේකම්,
නැගෙනහිර නුවරගම් පළාත,
අනුරාධපුර.

2016 ජූලි මස 29 වැනි දින.

08-452

ප්‍රා. ලේ./මීග/01/12/රා රේන්ද 2017.

**මීගමුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය**

රා රේන්ද විකිණීම - 2017

1982 අගෝස්තු මස 20 වැනි දින අංක 207 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ සඳහන් රා රේන්ද විකිණීමේ කොන්දේසි හා දැනට වලංගුව පවතින සුරාබදු බලපත්‍ර සම්බන්ධ පොදු කොන්දේසි අනුව පැසුණු රා සිල්ලරට පහත දැක්වෙන තැබෑරුම් සඳහා 2017 ජනවාරි මස 01 වැනි දින සිට 2017 දෙසැම්බර් 31 වැනි දින දක්වා තනි අයිතිය පිට විකිණීම සඳහා ටෙන්ඩර් පත් 2016.09.21 වැනි දින පෙ.ව. 10.30 දක්වා මවිසින් භාරගනු ලැබේ.

2. රා රේන්ද මත්පැන් හල ලබා ගැනීමට ඉදිරිපත්වන අය ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකින් ලබාගත හැකි නියමිත ටෙන්ඩර් ආකෘති පත්‍රයක් නිසියාකාරව සම්පූර්ණ කර මෙහි පහත දක්වා ඇති ටෙන්ඩර් මුදල ගෙවා ලබාගත් ප්‍රාදේශීය ලේකම් කාර්යාලයීය කුවිතාන්සිය ද, ප්‍රකාශිත රා රේන්ද කොන්දේසිය පරිදි ලබාගත් වත්කම් සහතිකය ද ඊට අදාළ ඔප්පුවේ ඡායා පිටපතක් ද, සහිතව මුද්‍රා තබන ලද කවරයක බහා, එහි වම් පස ඉහළ කෙළවරේ තමන් ටෙන්ඩර් කරනු ලබන තැබෑරුමේ අංකය සහ නම ද පැහැදිලිව ලියා ඒ ඒ තැබෑරුම් සඳහා මෙහි උපලේඛනයේ දැක්වෙන ටෙන්ඩර් භාරගැනීමේ අවසාන වේලාවට පෙර ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් හෝ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ තබා තිබෙන ටෙන්ඩර් පෙට්ටියේ තැන්පත් කිරීමෙන් මීගමුව ප්‍රාදේශීය ලේකම් වෙත ලැබෙන්නට සැලැස්විය යුතු ය.

3. ටෙන්ඩර්කරුවන් විසින් ටෙන්ඩර් පත්‍ර සම්පූර්ණ කිරීමේ දී ටෙන්ඩර් පත්‍රවල කරනු ලබන සෑම වෙනස් කිරීමක්ම ටෙන්ඩර්කරුවන් විසින් සම්පූර්ණ අත්සන යෙදීමෙන් සනාථ කළ යුතු ය. එසේ නොවන ටෙන්ඩර් පත්‍ර ප්‍රතික්ෂේප කරනු ලැබේ.

4. ටෙන්ඩර්පත්‍ර භාරගන්නා අවසාන දිනය වන 2016.09.21 වැනි දින පෙ.ව. 10.30 ට සියලුම ටෙන්ඩර්කරුවන් මීගමුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ පෙනී සිටිය යුතු ය.

5. අදාළ හා අත්‍යවශ්‍ය කරුණු සම්පූර්ණ කොට නොමැති අයදුම් පත්‍රයක් හෝ අයදුම්පත් සියල්ල ප්‍රතික්ෂේප කිරීමේ අයිතිය මා සතු වේ.

6. පූර්වෝක්ත දින විකිණීමට නොහැකි වූ රා තැබෑරුම් නැවත විකිණීම 2016.11.16 වැනි දින පෙ.ව. 10.30 ට සිදුකරනු ලැබේ. එදින ටෙන්ඩර්පත් ඉදිරිපත් කිරීම මෙම ගැසට් පත්‍රයේ දෙවන ඡේදයේ සඳහන් අවශ්‍යතාවයන්ට අනුකූල විය යුතු ය.

7. "තනි වරප්‍රසාද මිල දී ගත් තැනැත්තා" යැයි ප්‍රකාශයට පත්කිරීමෙන් අනතුරුව එසේ ප්‍රකාශ කළ දින එනම් රේන්ද විකුණන දින ප. ව. 3.00 ට පෙර මා විසින් නියම කරනු ලබන මාසික රේන්ද මුදල මෙන් දෙගුණයකට නොඅඩු මුදලක් ඇප තැන්පත් වශයෙන් මා වෙත ගෙවා තැබෑරුම් පිළිබඳ කොන්දේසිවලට අත්සන් කළ යුතු ය.

8. ටෙන්ඩර් ඉදිරිපත් කිරීමේ දී දැනගත යුතු වෙනත් විස්තර ඇත්නම් ඒවා මීගමුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් ලබා ගත හැකිය.

9. මෙම ටෙන්ඩර් විකිණීම සම්බන්ධයෙන් මාගේ තීරණය අවසාන තීරණය වේ.

ඒ. කේ. ආර්. අලවත්ත,
ප්‍රාදේශීය ලේකම්,
මීගමුව.

2016 අගෝස්තු මස 01 වැනි දින,
මීගමුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

උපලේඛනය

| තැබෑරුම් අංකය සහ නම | ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය | තැබෑරුම් පිහිටුවිය යුතු කොට්ඨාසය | තැබෑරුම් විවෘත කරන වේලාව සහ තැබෑරුම වසන වේලාව | ටෙන්ඩර් තැන්පත් මුදල රු. | ටෙන්ඩර් භාර ගැනීමේ අවසාන දිනය හා වේලාව |
|---|---|---|---|---|---|
| අංක 10 - සෙත්තපාඩුව | මීගමුව | සෙත්තපාඩුව පමණක් | පෙ. ව. 11.00 සිට ප.ව. 2.00 දක්වා ප. ව. 5.00 සිට ප. ව. 8.00 දක්වා | 5,000 | 2016.09.21 දින පෙ.ව. 10.30 දක්වා |
| අංක 11 - බසියවත්ත | එම | බසියවත්ත පමණක් | එම | එම | එම |
| අංක 12 - පිටිපන | එම | පිටිපන පමණක් | එම | එම | එම |
| අංක 15 - කුරණ | එම | කුරණ පමණක් | එම | එම | එම |
| අංක 16 - කාමෝච්චෝඩය | එම | කාමෝච්චෝඩය පමණක් | එම | එම | එම |
| අංක 17 - උඩයාර්තොප්පුව | එම | උඩයාර්තොප්පුව පමණක් | එම | එම | එම |
| අංක 18 - කුඩා පාඩුව | එම | කුඩාපාඩුව පමණක් | එම | 1,000 | එම |
| අංක 19 - දළුපත | එම | දළුපත පමණක් | එම | 5,000 | එම |
| අංක 20 - පෝරුතොට | එම | පෝරුතොට පමණක් | එම | 3,000 | එම |
| අංක 21 - කොච්චිකඩේ | එම | කොච්චිකඩේ ගමේ පමණක් | එම | 3,000 | එම |
| අංක 22 - පළඟතුරය | එම | පළඟතුර පමණක් | එම | 1,500 | එම |

08-436/1

# රජයේ නොවන දැන්වීම්

## නිවේදනයයි

2007 අංක 07 දරන සමාගම් පනතේ අංක 9 (1) වගන්තිය යටතේ නිවේදනයයි.

සමාගමේ නම : ටෙන් කේට් පර්මෙස් (ප්‍රයිවට්) ලිමිටඩ්
ලියාපදිංචි අංකය : පී වී 114223
ලියාපදිංචි ලිපිනය : 83/2, ධර්මපාල මාවත, කොළඹ 7
සංස්ථාගත කළ දිනය : 2016.06.08

ආර්. කේ. ජයවීර මිය,
සමාගම් ලේකම්.

08-391

## දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 09 (1) වගන්තිය යටතේ දැන්වීමයි.

(අ) සමාගමේ නම : අල් කමර් එන්ටර්ප්‍රයිසස් (ප්‍රයිවට්) ලිමිටඩ්
(ආ) සංස්ථාපිත දිනය : 2016.07.05
(ඇ) සමාගමේ අංකය : පී වී 114844
(ඈ) සමාගමේ ලිපිනය : අංක 1484/1, හෝකන්දර පාර, පන්නිපිටිය
සමාගමේ ලේකම්: එස් එම් එම් මකාම්, (Attorney - at- Law) අංක 367, 3 වැනි මහල, වේල්ල වීදිය, කොළඹ 12.
දුරකථන/ෆැක්ස් : 2448191, ජංගම : 0777325414, ඊමේල් : thelawoffice367@gmail.com

08-408/1

## දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 09 (1) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් සමාගම් සංස්ථාගත කොට ඇති බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

සමාගමේ නාමය : එන් ටී බී ලැන්ඩ්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පී වී 113282
ලියාපදිංචි කාර්යාලය : අංක 38, වරාගොඩ පාර, කැලණිය
දිනය : 2016.04.29

සමාගමේ නාමය : පෙගසස් ලැන්ඩ්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පී වී 113278
දිනය : 2016.04.29
ලියාපදිංචි කාර්යාලය : අංක 38, වරාගොඩ පාර, කැලණිය.

ඉබ්‍රාහිම් මොහොමඩ් අෂ්රාෆ්,
ලේකම්.

08-409

---

## ශ්‍රී ලංකා රිටේලර්ස් ඇසෝසියේෂන් (ගරන්ටි) ලිමිටඩ්

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය යටතේ සංස්ථාගත කිරීම පිළිබඳව මහජනතාවට කෙරෙන දැනුම්දීමයි

2016 ජුනි මස 03 වැනි දින සමාගම් ලියාපදිංචි අංක ජී. එල්. 2376 යටතේ ශ්‍රී ලංකා රිටේලර්ස් ඇසෝසියේෂන් (ගරන්ටි) ලිමිටඩ් යන නාමය යටතේ නව සමාගමක් සංස්ථාගත කරනු ලැබ ඇති බව සහ නව සමාගමේ ලියාපදිංචි කාර්යාලීය ලිපිනය කොළඹ 5, අමරසේකර මාවත, අංක 30 හි, බව අපි මෙයින් මහජනතාවට දැනුම් දෙමු.

කන්දයියා නීලකන්ඩන්,
සභාපති,
එන් ඇන්ඩ් එන් ඒජන්ට්ස් ඇන්ඩ්
සෙක්‍රටරීස් (ප්‍රයිවට්) ලිමිටඩ්,
(සමාගමේ සමාගම් ලේකම්වරු),

එම් ඇන්ඩ් එන් ගොඩනැගිල්ල,
(5 වන තලය),
අංක 2, ඩීල් පෙදෙස,
කොළඹ 3.

08-426

## ඇටෝර්නි බලපත්‍රය අවලංගු කිරීම

වයඹ පළාතේ, පුත්තලම් දිස්ත්‍රික්කයේ, ලුණුවිල තැපැල්, බොරලැස්ස, තිඹිරපාර පදිංචි ගස්බාරුගේ දිනේෂ් අනුර නිශාන්ත ප්‍රනාන්දු (810943610 V ) වන මා විසින් එකී රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ ඇටෝර්නි බලපත්‍ර පොතේ අංක 67 කාණ්ඩයේ 4710 පත්‍රිරුවේ දිනපොත් අංක 2378 යටතේ වර්ෂ 2013.08.27 වැනි දින ලියාපදිංචි කරන ලද, කුරුණෑගල දිස්ත්‍රික්කයේ ප්‍රසිද්ධ නොතාරිස් ආර්. ඩබ්. පී. එම්. ජී. රාජපක්ෂ මහතා 2013.08.18 වැනි දින ලියා සහතික කරන ලද අංක 9024 දරන ඇටෝර්නි බලපත්‍රය මගින් මාගේ ඇටෝර්නි බලකරු ලෙස අංක 835991989V දරන ජාතික හැඳුනුම්පත හිමි මාවතගම තැපැල්, රෝහල පාර, අංක 09 හි පදිංචි මිහිඳුකුලසූරිය දිලිනි තාරකා මිහිඳුකුලසූරිය යන අය පත්කළ අතර එකී ඇටෝර්නි බලපත්‍රය වහාම ක්‍රියාත්මක වන පරිදි අවලංගු කරන ලද බවත්, ඇය විසින් මාගේ ඇටෝර්නි බලකරු ලෙස මා වෙනුවෙන් කරනු ලබන කිසිදු ක්‍රියාවක් සඳහා මා වගකීම නොදරන බවත් ප්‍රකාශ කර සිටිමි.

ගස්බාරුගේ දිනේෂ් අනුර නිශාන්ත ප්‍රනාන්දු.

2016 ජූලි මස 28 වැනි දින.

08-435

---

## නිවේදනයයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (2) වගන්තිය යටතේ සංස්ථාගත කිරීම පිළිබඳ ප්‍රසිද්ධ දැන්වීම

සමාගමේ පෙර නම : එල් ඇන්ඩ් ටී ඉන්ෆ්‍රොස්ට්‍රක්චර් ඩිවෙලොප්මන්ට් ප්‍රොජෙක්ට්ස් ලංකා (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අලුත් නම : ඕක් ස්ට්‍රීට් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ නම වෙනස් වූ දිනය : 2016.07.27
සමාගමේ ලියාපදිංචි අංකය : පී වී 12729
සමාගමේ ලියාපදිංචි කාර්යාලය : කොළඹ 01, එචිලන් චතුරශ්‍රය, ලෝක වෙළඳ මධ්‍යස්ථානය, නැගෙනහිර කුලුණ, 16 වන තලය හි අංක 16-03 හි යන ස්ථානයේ බව අපි මෙයින් මහජනතාවට දැනුම් දෙමු.

සරවනන් නීලකන්ඩන්,
අධ්‍යක්ෂක,
එන් ඇන්ඩ් එන් ඒජන්ට්ස් ඇන්ඩ්
සෙක්‍රටරීස් (ප්‍රයිවට්) ලිමිටඩ්,
(සමාගමේ ලේකම්වරු),

එම්. ඇන්ඩ් එන්. ගොඩනැගිල්ල,
(5 වන තලය),
අංක 2, ඩීල් පෙදෙස,
කොළඹ 03.

08-471

## දැනුම්දීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 වගන්තියේ ප්‍රකාරව පහත නම් සඳහන් සමාගම සංස්ථාගත කළ බව මෙයින් දැනුම්දෙමු.

සමාගම් නාමය : එෆ්. අයි. ටී. ට්‍රැවල් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගම් අංකය : පී වී 115190
ලියාපදිංචි ලිපිනය : අංක 8, 2 වන පටුමග, දෙහිවල
සංස්ථාගත දිනය : 2016.07.22

කෝපරේට් ඇඩ්වයිසරි සර්විසස් (පීවීටී) එල්ටීඩී,
සමාගම් ලේකම්වරු.

08-486

---

## දැනුම්දීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 වගන්තියේ ප්‍රකාරව පහත නම් සඳහන් සමාගම සංස්ථාගත කළ බව මෙයින් දැනුම්දෙමු.

සමාගම් නාමය : එන්. සී. ඩී. එලායන්ස් ලංකා
සමාගම් අංකය : ජී ඒ 3215
ලියාපදිංචි ලිපිනය : ශ්‍රී ලංකා දියවැඩියා සංගමය බාරේ, 50, සරණ මාවත, රාජගිරිය
සංස්ථාගත දිනය : 2015 ජූලි 14

කෝපරේට් ඇඩ්වයිසරි සර්විසස් (පීවීටී) එල්ටීඩී,
සමාගම් ලේකම්වරු.

08-487

---

## දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනත යටතේ පහත සමාගම 2015.12.23 වැනි දින සංස්ථාපනය කරන ලද බව මහජනතාව වෙත 2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙනු ලැබේ.

ෆැබ්මෙක් ඉංජිනියර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්
ලියාපදිංචි අංකය : පී වී 110758
ලියාපදිංචි කාර්යාලය : අංක 626/12/10, සාම පෙදෙස, ජයන්ති පාර, අතුරුගිරිය.

නීතිඥ වී. ඒ. එන්. කේ. වික්‍රමසිංහ,
ලේකම්.

08-485

## එක්ස්මෙඩිස් ලංකා (ප්‍රයිවට්) ලිමිටඩ්

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය යටතේ සමාගමක් ලියාපදිංචි කිරීම සම්බන්ධ ප්‍රසිද්ධ දැන්වීමයි

එක්ස්මෙඩිස් ලංකා (ප්‍රයිවට්) ලිමිටඩ් 2016 ජූලි මස 28 වැනි දින සීමාසහිත සමාගමක් වශයෙන් ලියාපදිංචි කළ බව මෙයින් දන්වා සිටිමු.

සමාගමේ ලියාපදිංචි අංකය : PV 115355 වේ.
සමාගමේ ලියාපදිංචි කාර්යාලයේ ලිපිනය : අංක 116/10, රොස්මිඩ් පෙදෙස, කොළඹ 7

සෙන්ට්‍රල් කෝපරේට් ඇන්ඩ් කන්සල්ටන්සි
සර්විසස් (ප්‍රයිවට්) ලිමිටඩ්,
ලේකම්වරු.

අංක 116/10, රොස්මිඩ් පෙදෙස,
කොළඹ 07.

08-501

---

## සීමාසහිත සමාගම් ඒකාබද්ධ කිරීමේ පොදු නිවේදනය

ඩේන්ට් ෆුඩ්ස් ලිමිටඩ් (සමාගම් අංකය පී. බී. 1043)

සහ

ඩේන්ට් ලිමිටඩ් (සමාගම් අංකය පී. බී. 439)

ඩේන්ට් ෆුඩ්ස් ලිමිටඩ් (සමාගම් අංකය පී. බී. 1043), ඩේන්ට් ලිමිටඩ් (සමාගම් අංකය පී. බී. 439)යන සමාගම් දෙක 2007 අංක 07 දරන සමාගම් පනතේ 242 ඡේදයේ සඳහන් කොන්දේසි අනුව තනි සමාගමක් ලෙස ඒකාබද්ධ කරනු ලබන බව සමාගම් පනතේ අංක 242 (1) යන ඡේදය යටතේ මින් නිවේදනය කරනු ලැබේ.

ඒකාබද්ධ කරන ලද නව සමාගමේ නාමය ඩේන්ට් ලිමිටඩ් වන අතර එම ඒකාබද්ධය බලගැන්වනු ලබන්නේ 2016 ජූලි මස 29 වැනි දින හෝ සමාගම් ලියාපදිංචි කිරීමේ ජෙනරාල්වරයා විසින් අනුමත කරන ලද දිනයකදී විය හැක.

ඒකාබද්ධ වීමෙන් පසු ඩේන්ට් ලිමිටඩ් තම ලියාපදිංචි කාර්යාලය අංක 72/සී, කන්දවල පාර, රත්මලාන හි පිහිටවනු ලැබේ.

ඒකාබද්ධ කරනු ලබන සමාගම් වල යම් කොටස්කරුවන්, ණයහිමියන් එකී ඒකාබද්ධ කරණු ලබන සමාගම සමග යම් බැඳීමකට යටත්ව ඇති යම් තැනැත්තෙකු විසින් පරීක්ෂා කර බැලීම සඳහා ඒකාබද්ධ යෝජනාවේ පිටපත් සමාගමේ ලියාපදිංචි කාර්යාලය අංක 72/සී, කන්දවල පාර, රත්මලාන යන ස්ථානයේ සමාගමේ සේවාකාලය තුලදී නොමිලේ ලබාගත හැක.

ඒකාබද්ධ වන සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලයේ නියමය පරිදි,

බිස්නස් ඇන්ඩ් ඉන්ඩස්ට්‍රියල් කන්සල්ටන්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්,
සමාගම් ලේකම්වරු.

2016 ජූලි මස 05 වැනි දින.
චාටර් හවුස්,
අංක 65/2,
චිත්තම්පලම් ඒ ගාර්ඩිනර් මාවත,
කොළඹ 02.

08-510

---

## දැන්වීමයි

වර්ෂ 2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) වැනි වගන්තිය ප්‍රකාරව, පහත සඳහන් සමාගම සංස්ථාපිත කළ බවට මෙයින් දන්වමු.

සමාගමේ නම : රොසෙකු ඉංජිනියරිං (පීවීටී) එල්ටීඩී
ලියාපදිංචි අංකය : පී වී 76792
ලියාපදිංචි කාර්යාලීය ලිපිනය : අංක 92/3, බැද්දගාන පාර, උතුර, කෝට්ටේ
ලියාපදිංචි දිනය : 2011.01.27

(ඉහත සඳහන් සමාගමේ ලේකම්වරු)

08-511

---

## දැන්වීමයි

වර්ෂ 2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) වැනි වගන්තිය ප්‍රකාරව, පහත සඳහන් සමාගම සංස්ථාපිත කළ බවට මෙයින් දන්වමු.

සමාගමේ නම : සෝලර් වර්ල්ඩ් (පීවීටී) එල්ටීඩී
ලියාපදිංචි අංකය : පී වී 114516
ලියාපදිංචි කාර්යාලීය ලිපිනය : අංක 12/1/1, සුනේත්‍රා දේවි පාර, කොහුවල, නුගේගොඩ
ලියාපදිංචි දිනය : 2016.06.21

(ඉහත සඳහන් සමාගමේ ලේකම්වරු)

08-512

## දැන්වීමයි

වර්ෂ 2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) වැනි වගන්තිය ප්‍රකාරව, පහත සඳහන් සමාගම සංස්ථාපිත කළ බවට මෙයින් දන්වමු.

සමාගමේ නම : ෆුට් රිලැක්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්
ලියාපදිංචි අංකය : පී. වී. 115085
ලියාපදිංචි කාර්යාලීය ලිපිනය : අංක 155/11, පන්නිපිටිය පාර, තලවතුගොඩ
ලියාපදිංචි දිනය : 2016.07.18

(ඉහත සඳහන් සමාගමේ ලේකම්වරු)

08-514

---

## දැන්වීමයි

වර්ෂ 2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) වැනි වගන්තිය ප්‍රකාරව, පහත සඳහන් සමාගම සංස්ථාපිත කළ බවට මෙයින් දන්වමු.

සමාගමේ නම : ට්‍රැවල් ලෙෂර් කළම්බු එස් එල් (පීවීටී) එල්ටීඩී
ලියාපදිංචි අංකය : පී වී 114280
ලියාපදිංචි කාර්යාලීය ලිපිනය : අංක 65/3, ශ්‍රීමත් චිත්තම්පලම් ඒ ගාර්ඩන් මාවත, කොළඹ 02
ලියාපදිංචි දිනය : 2016.06.10

(ඉහත සඳහන් සමාගමේ ලේකම්වරු)

08-515

---

## දැන්වීමයි

වර්ෂ 2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) වැනි වගන්තිය ප්‍රකාරව, පහත සඳහන් සමාගම සංස්ථාපිත කළ බවට මෙයින් දන්වමු.

සමාගමේ නම : ෆ්‍රෙෂ් බවුන්ස් (පීවීටී) එල්ටීඩී
ලියාපදිංචි අංකය : පී වී 114515
ලියාපදිංචි කාර්යාලීය ලිපිනය : අංක 12/1/1, සුනේත්‍රා දේවි පාර, කොහුවල, නුගේගොඩ
ලියාපදිංචි දිනය : 2016.06.21

(ඉහත සඳහන් සමාගමේ ලේකම්වරු)

08-516

## ඇටෝර්නි බලපත්‍රය අවලංගු කිරීම

කොළඹ 15, ශ්‍රී රාමනාතන් මාවත, අංක 260 (වර්තමානයේ කොළඹ 15, සා. ඇන්ඩෘස් මාවත, අංක 168) හි පදිංචි දෙන් සුදත් ලසන්ත ප්‍රදීප් කුමාර විජේසිංහ වන මම ප්‍රසිද්ධ නොතාරිස් හිරන්ති දීපිකා මොරවක මහත්මිය විසින් 2015 පෙබරවාරි මස 9 වැනි දින ලියා සකස් කරන ලද අංක 672 දරන ඇටෝර්නි බලපත්‍රය මගින් උණවටුන, ආයුර්වේද විලේජ් ගාඩ්න් හි පදිංචි යමුනා ලලංගනී කතලුව ලියනගේ (ජාතික හැඳුනුම්පත් අංක 607770262 V ) යන අය වෙත පවරන ලද සියලුම බලතල හා වගකීම් අද දින සිට ක්‍රියාත්මක වන පරිදි මෙයින් අවලංගු කරන අතර,

මෙයින් මතු එකී ඇටොර්නි බලපත්‍රය මත ඉහත කී යමුනා ලලංගනී කතලුව ලියනගේ යන අය විසින් කරනු ලබන සියලුම ක්‍රියාකාරකම් සම්බන්ධයෙන් මා විසින් කිසියම් හෝ වගකීමක් දැරීමට බැඳී නොමැති බවත්, මෙමගින් ශ්‍රී ලංකාවාසී සියලු දෙනාට ම දැනුම් දෙමි.

ඩී. එස්. එල්. පී. කේ. විජේසිංහ.

08-519

---

## ඇටෝර්නි බලපත්‍රය අහෝසි කිරීම

54A, පළුවැල්ගාල, ඉහල කොට්ටරාමුල්ල පදිංචි කනපදි චන්දිමාල් සංජීව වන මාගේ ඇටොර්නි බලකරු ලෙස මාතර දිස්ත්‍රික්කයේ පරණ තංගල්ල පාර අංක 235 පදිංචි ජාතික හැඳුනුම්පත් අංක 871982368 V හිමි බොනිෆස් ප්‍රදීප් ජැන්ස් පත් කරමින් කේ. දුලානි එච්. කීර්තිසිංහ අතිරේක සහකාර රෙජිස්ට්‍රාර් ජනරාල් (ගාලු දිස්ත්‍රික්කය) සහතික කරන ලද අංක 4695 සහ 2014.09.23 දිනැති ඇටෝර්නි බලපත්‍රය 2016.08.02 දින සිට අවලංගු කරන බවත්, ඒ මත මාගේ ඇටෝර්නි බලකරු ලෙස පත්කල බොනිෆස් ප්‍රදීප් ජැන්ස් යන අය මින් ඉදිරියට මාගේ ඇටෝර්නි බලකරු ලෙස ක්‍රියා නොකරන බවත්, එකී ඇටෝර්නි බලපත්‍රය මත ඔහු කරනු ලබන කිසිදු ක්‍රියාවක් අපගේ ක්‍රියාවක් ලෙස නොසලකන බවත් ශ්‍රී ලංකා වාසි සියලු දෙනා වෙත මෙයින් දන්වා සිටිමි.

කනපදි චන්දිමාල් සංජීව.

08-539

---

## දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය යටතේ කරනු ලබන දැන්වීම

සමාගමේ නම : ජේ ඇන්ඩ් එම් හෝල්ඩිංස් ඉන්ටර්නැෂනල් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පී වී 114921
ලියාපදිංචි ලිපිනය : අංක 40, ගෝල්ෆේස් කෝට් 02, කොළඹ 03

සෙක්‍රටේරියස් (ප්‍රයිවට්) ලිමිටඩ්
පීවී 5958

08-541/1

## දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය යටතේ කරනු ලබන දැන්වීම

සමාගමේ නම : පී ඇන්ඩ් ආර් ට්‍රේඩිං ලංකා (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පී වී 115030
ලියාපදිංචි ලිපිනය : අංක 40, ගෝල්ෆේස් කෝට් 02, කොළඹ 03

සෙක්‍රටේරියස් (ප්‍රයිවට්) ලිමිටඩ්
පීවී 5958

08-541/2

---

## ප්‍රසිද්ධ දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 59 (2) වගන්තිය යටතේ පළකරන දැන්වීම

කොළඹ 03, ගාලු පාර, අංක 109 හි ''රොටුන්ඩා ටවර්ස්'' ගොඩනැගිල්ලේ ලියාපදිංචි කළ කාර්යාලය සහිත එටිසලාට් ලංකා (ප්‍රයිවට්) ලිමිටඩ් සමාගම (''සමාගම'') රුපියල් බිලියන දහතුනයි මිලියන හයසිය හැටයි හත් ලක්ෂ විසිතුන් දහස් හත්සිය අසූ තුනයි ශත එකොළහ (රු. 13,660,723,783.11) වන එකී වත්මන් ප්‍රකාශිත ප්‍රාග්ධනය රුපියල් බිලියන හයයි මිලියන හත්සිය අනූ හතයි අට ලක්ෂ හතලිස් හත් දහස් අටසිය අටයි ශත එකොළහ (රු. 6,797,847,808.11) දක්වා අඩු කිරීමට යෝජනා කර ඇති බව සමාගම් පනතේ 59(2) වගන්තිය ප්‍රකාර, මෙයින් දැනුම් දෙනු ලැබේ.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

එටිසලාට් ලංකා (ප්‍රයිවට්) ලිමිටඩ්,
ලේකම්.

08-552

---

## 2007 අංක 07 දරන සමාගම් පනතේ 09 වැනි වගන්තිය යටතේ කරනු ලබන දැන්වීම

සමාගමේ නම : ඇස්පයිරිං ට්‍රේඩ් ඉන්ටර්නැෂනල් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පී වී 115447
ලියාපදිංචි කාර්යාලයේ ලිපිනය : අංක 249, පරණ කොට්ටාව පාර, ඇඹුල්දෙනිය, උඩහමුල්ල
සංස්ථාගත කළ දිනය : 2016.08.02
අධ්‍යක්ෂ : ඩබ්ලිව්. පී. ජේ. එෆ්. ජයසූරිය.

08-567

### දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය ප්‍රකාරව මෙයින් නිවේදනය කරනු ලැබේ.

සමාගමේ නම : ඒ එම් සර්විසස් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පී වී 115439
ලියාපදිංචි කළ දිනය : 2016 අගෝස්තු මස 6 වැනි දින,
ලියාපදිංචි කාර්යාලය : අංක 62 -1/1, අනුලා පාර, කොළඹ 06.

එස්. රාජකුලේන්ද්‍ර මිය,
නීතිඥ.

අංක 34/1, නෙල්සන් පෙදෙස,
වැල්ලවත්ත,
කොළඹ 06.

08-571

---

### ඇටෝර්නි බලපත්‍රය ප්‍රත්‍යාදිෂ්ඨ කිරීම

පානදුර, අළුබෝමුල්ල එස්. මහින්ද මාවත, අංක 24/5 සහ දැනට සයිප්‍රස්, නිකෝෂියා, 2042, ස්ට්‍රොවොලෝස්, පීටර්මේරයිඩ් වීදිය, වාරලාම්බෝ, අංක 21/ඒ, හි පදිංචි හෙට්ටිආරච්චිගේ සුමිත්‍රා (ජා. හැ. අ. 718460565 V විදේශ ගමන් බලපත්‍රය එන්. 5305845) වන මා විසින් මාගේ ඥාති පුත්‍රයා වන පානදුර අළුබෝමුල්ල, එස්. මහින්ද මාවත, අංක 24/5 හි පදිංචි හෙට්ටිආරච්චිගේ රමේෂ් ජීවන්ත (ජා. හැ. අ. 912851672 වී) යන අයට මා විසින් පවරා ඇති කේ. පී. ජී. වී. කේ. ඩයස් ගුණසේකර ප්‍ර. නො. ලියා සහතික කළ අංක 824 සහ 2015.03.02 දරන ඇටෝර්නි බලපත්‍රය බලරහිත කරන බවත්, ඔහු විසින් කරන කිසිම ගනුදෙනුවකට මම වග නොකියන බවත්, ශ්‍රී ලංකා රජයටත්, මහජනතාවටත් මෙයින් දන්වා සිටමි.

08-583

---

### දැන්වීමයි

2016.06.24 වැනි දින සමාගමක් සංස්ථාපනය කිරීම පිළිබඳව 2007 අංක 7 දරන සමාගම් පනතේ 9 වැනි වගන්තිය ප්‍රකාර මෙසේ නිවේදනය කරනු ලැබේ.

සමාගමේ නම : රිෂානා ට්‍රේඩිං (පීවීටී) එල්ටීඩී
RISHANA TRADING (PVT) LTD
අංක : පී වී 114602
ලියාපදිංචි කාර්යාලය : 128, කොහිලවත්ත, අංගොඩ.

අලී හසන් මොහොමඩ් ගස්සාලි,
ලේකම්.

08-586

### දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 09 වන වගන්තිය යටතේ දැන්වීමයි.

සමාගමේ නම : ජැපැන් ලංකා ටෙක්නොලොජි ඇන්ඩ් කල්චරල් සෙන්ටර් (ප්‍රයිවට්) ලිමිටඩ්
සංස්ථාගත කළ දිනය : 2010.09.09
ලියාපදිංචි අංකය : පී.වී. 74251
ලියාපදිංචි කාර්යාලය : ගම්පහ ප්‍රාදේශීය සභා බිල්ඩින්, මිරිස්වත්ත, මුදුන්ගොඩ.

එස්. ආර්. පී. සිරත්,
සමාගම් අධ්‍යක්ෂක.

08-457

---

### ඇටෝර්නි බලය අවලංගු කිරීම

දන්කොටුව දවටගහවත්ත මිල්රෝඩ් ලිපිනයෙහි පදිංචි පැටිකිරි ආරච්චිගේ සංජය ශ්‍රීනාත් වන මා විසින් දන්කොටුව දවටගහවත්ත මිල්රෝඩ් යන ලිපිනයෙහි පදිංචි පැටිකිරි ආරච්චිගේ අචිනි සුරංගිකා වෙත පවරාදෙන ලද මතුගම ප්‍රසිද්ධ නොතාරිස් අක්ෂිකා ද සිල්වා විසින් සහතික කරන ලද අංක 53 දරන 2014 ජූලි මස 18 වැනි දිනැති ඇටෝර්නි බලය ප්‍රත්‍යාදිෂ්ඨ කර අවලංගු කරන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

පැටිකිරි ආරච්චිගේ සංජය ශ්‍රීනාත්.

08-481

---

### දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 වැනි වගන්තිය ප්‍රකාරව

ඉටෙලාසොෆ්ට් (පීවීටී) එල්ටීඩී (පී වී 76864) නම් වූ සමාගමක් 2011 පෙබරවාරි මස පළමු වැනි දින සංස්ථාගත කළ බව මෙයින් දැනුම් දෙනු ලැබේ. ලියාපදිංචි කාර්යාලයේ ලිපිනය 246, කන්දකුරුඳු වත්ත, දෙදියවල, වස්කඩුව.

කැල්රුප්කෝ මැනේජ්මන්ට් සර්විසස් (ප්‍රයිවට්) ලිමිටඩ්,
සමාගමේ ලේකම්වරු.

08-411

### ප්‍රසිද්ධ දැන්වීමයි

පහත සඳහන් වගකීමෙන් සීමිත සමාගම 2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය ප්‍රකාරව සංස්ථාගත කළ බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

| *සමාගමේ නම* | *පී වී අංකය* | *ලියාපදිංචි කළ කාර්යාලය* |
|---|---|---|
| ලැකුම් (ප්‍රයිවට්) ලිමිටඩ් | පී වී 114074 | සමාගම් ලේකම්වරු, සෙක්‍රටේරියල් හවුස් (ප්‍රයිවට්) ලිමිටඩ්, අංක 10, හැව්ලොක් පෙදෙස, කොළඹ 05 |
| බෝන් ඩිවලොප්මන්ට්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් | පී වී 114288 | සෙක්‍රටේරියල් හවුස් (ප්‍රයිවට්) ලිමටඩ්, අංක 10, හැව්ලොක් පෙදෙස, කොළඹ 05 |
| මැග්‍රඩෙස්ටෙ ඉන්වෙස්ට්මන්ට්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් | පී වී 114290 | සෙක්‍රටේරියල් හවුස් ඇඩ්වයිසරි (ප්‍රයිවට්) ලිමිටඩ්, සමාගම් ලේකම්වරු, අංක 10, හැව්ලොක් පෙදෙස, කොළඹ 05 |
| හැන්ග් ඉලෙවන් ඉන්වෙස්ට්මන්ට්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් | පී වී 114472 | සෙක්‍රටේරියල් හවුස් ඇඩ්වයිසරි (ප්‍රයිවට්) ලිමිටඩ්, සමාගම් ලේකම්වරු, අංක 10, හැව්ලොක් පෙදෙස, කොළඹ 05 |
| තම්බා ප්‍රොපර්ටීස් (ප්‍රයිවට්) ලිමිටඩ් | පී වී 114572 | අංක 10, හැව්ලොක් පෙදෙස, කොළඹ 05 |
| තම්බා එස්ටේට්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් | පී වී 114632 | අංක 6, පෙඩ්ලර් වීදිය, කොටුව, ගාල්ල |
| සම් සම් ෆවුන්ඩේෂන් (ගරන්ටි) ලිමිටඩ් | ජී එල් 2268 | අංක 83 - 2/4, ගාලු පාර, වැල්ලවත්ත, කොළඹ 06 |
| ෆාත් ඇකඩමි (ගරන්ටි) ලිමිටඩ් | ජී එල් 2330 | අංක 11, දුම්රියපොල පාර, කොළඹ 04. |

සෙක්‍රටේරියල් හවුස් ඇඩ්වයිසරි (ප්‍රයිවට්) ලිමිටඩ්,
සමාගම් ලේකම්වරු.

අංක 10, හැව්ලොක් පෙදෙස
කොළඹ 05.

08-580

---

# රටබීම විකිණීමේ බලපත්‍ර සඳහා වූ අයදුම්පත්

ප්‍රා. ලේ./මීග/01/12/රා රේන්ද 2017.

### මීගමුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය - විදේශ මත්පැන් විකිණීම - 2017 වර්ෂය

1982 අගෝස්තු මස 20 වැනි දින අංක 207 දරන *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* සඳහන් රා රේන්ද විකිණීමේ කොන්දේසි හා දැනට වලංගුව පවතින සුරාබදු බලපත්‍ර සම්බන්ධ පොදු කොන්දේසි අනුව පැසුණු රා සිල්ලරට පහත දැක්වෙන විදෙස් මත්පැන්හල සඳහා 2017 ජනවාරි මස 01 වැනි දින සිට 2017 දෙසැම්බර් මස 31 වැනි දින දක්වා තනි අයිතිය පිට විකිණීම සඳහා ටෙන්ඩර්පත් 2016.09.21 වැනි දින පෙ.ව. 10.30 දක්වා මවිසින් භාරගනු ලැබේ.

2. රා රේන්ද හා විදෙස් මත්පැන්හල ලබා ගැනීමට ඉදිරිපත් වන අය ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකින් ලබාගත හැකි නියමිත ටෙන්ඩර් ආකෘති පත්‍රයක් නිසියාකාරව සම්පූර්ණ කර මෙහි පහත ඇති ටෙන්ඩර් මුදල ගෙවා ලබාගත් ප්‍රාදේශීය ලේකම් කාර්යාලයීය කුවිතාන්සිය ද, ප්‍රකාශිත රා රේන්ද කොන්දේසිය පරිදි ලබාගත් වත්කම් සහතිකය ද ඊට අදාළ ඔප්පුවේ ඡායා පිටපතක් ද, සහිතව මුද්‍රා තබන ලද කවරයක බහා, එහි වම්පස ඉහළ කෙළවරේ තමන් ටෙන්ඩර් කරනු ලබන තැබෑරුමේ අංකය සහ නම ද පැහැදිලිව ලියා ඒ ඒ තැබෑරුම් සඳහා මෙහි උපලේඛනයේ දැක්වෙන ටෙන්ඩර් භාරගැනීමේ අවසාන වේලාවට පෙර ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් හෝ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ තබා තිබෙන ටෙන්ඩර් පෙට්ටියේ තැන්පත් කිරීමෙන් මීගමුව ප්‍රාදේශීය ලේකම් වෙත ලැබෙන්නට සැලැස්විය යුතු ය.

3. ටෙන්ඩර්කරුවන් විසින් ටෙන්ඩර් පත්‍ර සම්පූර්ණ කිරීමේ දී ටෙන්ඩර් පත්‍රවල කරනු ලබන සෑම වෙනස් කිරීමක්ම ටෙන්ඩර්කරුවන් විසින් සම්පූර්ණ අත්සන යෙදීමෙන් සනාථ කළ යුතු ය. එසේ නොවන ටෙන්ඩර් පත්‍ර ප්‍රතික්ෂේප කරනු ලැබේ.

4. ටෙන්ඩර්පත්‍ර භාරගන්නා අවසාන දිනය වන 2016.09.21 වැනි දින පෙ.ව. 10.30 ට සියලුම ටෙන්ඩර්කරුවන් මීගමුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ පෙනී සිටිය යුතු ය.

5. අදළ හා අත්‍යවශ්‍ය කරුණු සම්පූර්ණ කොට නොමැති අයදුම් පත්‍රයක් හෝ අයදුම්පත් සියල්ල ප්‍රතික්ෂේප කිරීමේ අයිතිය මා සතු වේ.

6. පූර්වෝක්ත දින විකිණීමට නොහැකි වූ විදේශ මත්පැන් හල නැවත විකිණීම 2016.11.16 වැනි දින පෙ.ව. 10.30 ට සිදු කරනු ලැබේ. එදින ටෙන්ඩර්පත් ඉදිරිපත් කිරීම මෙම ගැසට් පත්‍රයේ දෙවන ඡේදයේ සඳහන් අවශ්‍යතාවන්ට අනුකූල විය යුතු ය.

7. "තනි වරප්‍රසාද මිල දී ගත් තැනැත්තා" යැයි ප්‍රකාශයට පත් කිරීමෙන් අනතුරුව එසේ ප්‍රකාශ කළ දින එනම් රේන්ද විකුණන දින ප. ව. 3.00 ට පෙර මා විසින් නියම කරනු ලබන මාසික රේන්ද මුදල මෙන් දෙගුණයකට නොඅඩු මුදලක් ඇප තැන්පත් වශයෙන් මා වෙත ගෙවා තැබෑරුම් පිළිබඳ කොන්දේසිවලට අත්සන් කළ යුතු ය.

8. ටෙන්ඩර් ඉදිරිපත් කිරීමේ දී දැනගත යුතු වෙනත් විස්තර ඇත්නම් ඒවා මීගමුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් ලබා ගත හැකිය.

9. මෙම ටෙන්ඩර් විකිණීම සම්බන්ධයෙන් මාගේ තීරණය අවසාන තීරණය වේ.

ඒ. කේ. ආර්. අලවත්ත,
ප්‍රාදේශීය ලේකම්,
මීගමුව.

2016 අගෝස්තු මස 01 වැනි දින,
මීගමුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

*උපලේඛනය*

| *තැබෑරුම් අංකය සහ නම* | *ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය* | *තැබෑරුම් පිහිටුවිය යුතු කොට්ඨාසය* | *තැබෑරුම් විවෘත කරන වේලාව සහ තැබෑරුම වසන වේලාව* | *ටෙන්ඩර් තැන්පත් මුදල රු.* | *ටෙන්ඩර් භාර ගැනීමේ අවසාන දිනය හා වේලාව* |
|---|---|---|---|---|---|
| අංක 02 - ග්‍රීන් බාර් (විදෙස් මත්පැන් හල) | මීගමුව | අංක 8 කොට්ඨාසයේ කුණ්ඩන්විල පමණක් | පෙ. ව. 11.00 සිට ප.ව. 2.00 දක්වා ප. ව. 5.00 සිට ප. ව. 8.00 දක්වා | 3,000 | 2016.09.21 දින පෙ.ව. 10.30 දක්වා |

08-436/2

**කොළඹ දිස්ත්‍රික්කය - මොරටුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය**

රටබීම තැබෑරුම් සඳහා රේන්ද විකිණීම - 2017 වර්ෂය

රජයෙන් අනුමත කරන ලද පහත සඳහන් ප්‍රාදේශීය ප්‍රදේශයන්හි සුදුසු ස්ථානයක 2017 ජනවාරි මස 01 වැනි දින සිට 2017 දෙසැම්බර් මස 31 වැනි දින දක්වා තනි අයිතිය පිට පහත සඳහන් කොන්දේසිවලට යටත්ව රටබීම (මෙරට සාදන ලද ධාන්‍ය මත්පැන් ඇතුළුව) විකිණීම සඳහා ටෙන්ඩර්පත්‍ර භාරගනු ලැබේ.

1. 1982.08.20 දින හා අංක 207 දරන *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* දැක්වෙන රටබීම තැබෑරුම් රේන්ද විකිණීම් කොන්දේසිය.
2. සුරාබදු බලපත්‍ර සම්බන්ධව දැනට පවතින පොදු කොන්දේසි.

02. පහත දැක්වෙන ස්ථානයන්ගෙන් ලබාගත හැකි නියමිත ආකෘති පත්‍ර මාර්ගයෙන් රු. 5,000 ක මුදලක් තැන්පත් කළ බවට ඕනෑම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකින් ලබාගත් කුවිතාන්සියක් හා අදාළ ප්‍රාදේශීය ලේකම්ගෙන් ලබාගත් වත්කම් සහතිකයක් ද සමග ටෙන්ඩර් පත්‍ර එවිය යුතු ය. එම වත්කම් සහතිකයන්හි උපලේඛනයේ ඇතුළත්, එසේම එම සහතික නිකුත් කිරීම සඳහා පදනම් කරගත් කිසිදු දේපළක් විකුණා නැත්නම්, එම වත්කම් සහතිකය නිකුත් කළ දින සිට අවුරුදු පහක් (05) වලංගු වේ. රේන්ද කාලය අවසන් වීමට පෙර වත්කම් සහතිකය වලංගු කාලය අවසන් වන අවස්ථාවන්හි දී සම්පූර්ණ රේන්ද කාලය සඳහා වලංගුවන අළුත් වත්කම් සහතිකයක් ටෙන්ඩරය සමග ඉදිරිපත් කළ යුතු ය :-

*(ඒ)* ඕනෑම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකින්,
*(බී)* කොළඹ 02, ස්ටේපල් වීදිය, සුරාබදු කාර්යාලයෙන්,
*(සී)* කොළඹ සුරාබදු මණ්ඩල කාර්යාලය.

03. කවරයක බහා මුද්‍රා තබන ලද එක් එක් ටෙන්ඩර් පත්‍රය ඇතුළත් කවරයේ වම් කෙළවරේ මෙසේ සඳහන් කළ යුතු ය. "2017 වර්ෂයේ මොරටුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ අංක 9 දරන රටබීම තැබෑරුම සඳහා ටෙන්ඩර් පත්‍රයයි." ටෙන්ඩර් පත්‍ර 2016.09.15 වැනි දින පෙ.ව. 10.30 ට පෙර ලැබෙන සේ මොරටුව ප්‍රාදේශීය ලේකම් වෙත එවිය යුතු ය. ටෙන්ඩර්කරුවන් ටෙන්ඩර් භාර ගන්නා අවසන් වේලාවේ දී, මොරටුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට පැමිණිය යුතු ය.

04. තෝරාගත් ටෙන්ඩර්කරු, ඒ මොහොතේම, ගැණුම්කරු වශයෙන් දැනුම් දෙනු ලබන අතර, නියම කරනු ලබන මුදල්, තැන්පත් ඇප මුදල වශයෙන් මොරටුව ප්‍රාදේශීය ලේකම් වෙත ගෙවිය යුතු ය.

05. සාර්ථක ටෙන්ඩර්කරුට, ඔහුගේ ටෙන්ඩර් පත්‍රය, පිළිගත් බව දැන්වූ විට රේන්ද විකිණීමේ කොන්දේසි අත්සන් කිරීම හෝ නියම කළ ඇප මුදල් යථා කාලයේ දී තැන්පත් කිරීම හෝ පැහැර හැරියහොත් ඔහු විසින් තැන්පත් කරන ලද ටෙන්ඩර් තැන්පත් මුදල් අහිමි වන අතර, ඔහුගේ නම වරදකරුවෙකු වශයෙන් සුරාබදු බලපත්‍රකරුවන්ගේ ලැයිස්තුවට ඇතුළත් කරනු ලැබේ. සාර්ථක ටෙන්ඩර්කරු හෝ ලන්සුකරු විසින් හෝ සම්පූර්ණ ඇප මුදල තැන්පත් කර විකිණීමේ කොන්දේසි අඩංගු ගිවිසුම් අත්සන් කළ පසු, ටෙන්ඩර්කරුවන්ගේ ටෙන්ඩර් තැන්පත් මුදල ආපසු ගෙවනු ලැබේ.

06. කිසිදු හේතුවක් නොදක්වාම, එකක් හෝ සියලුම ටෙන්ඩර් ප්‍රතික්ෂේප කිරීමේ බලය ප්‍රාදේශීය ලේකම්තුමාට ඇත.

07. මෙම විදේශ මත්පැන් තැබෑරුම, මොරටුව මහ නගර සභා, කොට්ඨාස අංක 09 හි පවත්වාගෙන යා යුතු ය. සාර්ථක ටෙන්ඩර්කරු විසින් කොට්ඨාසය තුළින් සුදුසු ගොඩනැගිල්ලක් සපයා ගත යුතු අතර, එකී ගොඩනැගිල්ල සඳහා සුරාබදු කොමසාරිස්ගේ අනුමැතිය ලබාගත යුතු වේ. ගොඩනැගිලි සපයා දීමට ප්‍රාදේශීය ලේකම් බැඳී නොමැති බැව් සැලකිය යුතු ය.

08. අනුමත කරන ලද රටබීම තැබෑරුම් ලැයිස්තුව පහත දැක්වේ :

| අනුක්‍රමික අංකය | කොට්ඨාසය | ප්‍රාදේශීය ප්‍රදේශයේ තැබෑරුම් අයත් විය යුතු ප්‍රදේශය | තැබෑරුම විවෘත කරන වේලාව | තැබෑරුම වසන වේලාව | ටෙන්ඩරය සඳහා තැන්පත් කළ යුතු මුදල (රු.) | ටෙන්ඩරය භාර ගන්නා අවසන් වේලාව | විකිණීම කරන දිනය |
|---|---|---|---|---|---|---|---|
| 1. | අංක 9 කොට්ඨාසය, මොරටුව මහ නගර සභාව | මොරටුව මහ නගර සභාවේ අංක 09 කොට්ඨාසයේ ගාලු පාරේ බටහිර පෙදෙසේ පිහිටි මොරටුවැල්ල ගමේ පමණක් | පෙ.ව. 11.00 ප.ව. 5.00 | ප.ව. 2.00 ප.ව. 8.00 | 5,000 | පෙ.ව. 10.30 | 2016.09.15 |

09. වැඩි විස්තර මොරටුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් ලබාගත හැකිය.

10. *වැදගත්* . - 2016.09.15 වැනි දින විකිණීමට නොහැකි වුවහොත් මෙම විදේශීය මත්පැන් රේන්දය 2016.11.17 වැනි දින පෙ.ව.10.30 ට නැවත විකුණනු ලැබේ.

එච්. ආර්. එච්. කරුණාරත්න,
ප්‍රාදේශීය ලේකම් - මොරටුව.

2016 ජූලි මස 27 වැනි දින,
මොරටුව ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාලයේ දී ය.

08-398

---

## මහනුවර දිස්ත්‍රික්කයේ දෙල්තොට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ විදේශ මත්පැන් තැබෑරුම

2016/2017 වර්ෂය සඳහා වූ රේන්ද විකිණීම

1982 අගෝස්තු මස 20 වැනි දින අංක 207 දරන *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධ කළ 1983 වර්ෂය හා ඊට පසු කාලපරිච්ඡේදය සඳහා විදේශ මත්පැන් තැබෑරුම් රේන්ද විකිණීමේ කොන්දේසිවලටත්, එම කාලය තුළ දී වලංගු සෑම සුරා බදු බලපත්‍රයක් කෙරෙහිම බලපාන පොදු සුරා බදු කොන්දේසිවලටත්, මත්පැන් සිල්ලරට විකිණීමේ වරප්‍රසාදයක් මිල දී ගැනීම සඳහා දෙල්තොට ප්‍රාදේශීය ලේකම්/අතිරේක දිසාපති තැන වන මා විසින් 2016.08.29 වැනි දින පෙ.ව. 10.30 වන තෙක් ටෙන්ඩර් භාරගනු ලැබේ.

02. සෑම ටෙන්ඩරයක්ම දිවයිනේ ඕනෑම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකින් ම ලබාගත හැකි ආකෘති පත්‍රයක සකස් විය යුතු අතර -

*(අ)* ටෙන්ඩර් තැන්පත් මුදල් වශයෙන් ඕනෑම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකින් පහත සඳහන් උපලේඛනයෙහි සඳහන් කර ඇති අන්දමට නිසි ටෙන්ඩර් ඇප මුදලක් තැන්පත් කර ඒ සඳහා ලබා ගත් කුවිතාන්සිය ; සහ

*(ආ)* ටෙන්ඩර්කරුගේ ඉඩකඩම් ආදී නිශ්චල දේපළ පිහිටා ඇති ප්‍රදේශයේ ප්‍රාදේශීය ලේකම්ගෙන් ලබාගත් වත්කම් සහතිකයක් ඉදිරිපත් කළ යුතු ය.

03. ටෙන්ඩර් සහ වත්කම් සහතිකය ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් යථොක්ත විදේශ මත්පැන් තැබෑරුම රේන්ද විකිණීමේ කොන්දේසි මාලාවේ අඩංගුව ඇති නියමයන් විධිමත් ලෙස පිළිපැදිය යුතු බව ටෙන්ඩර් ඉදිරිපත් කරන්නන් වෙත තරයේ නිවේදනය කරනු ලැබේ. ටෙන්ඩර් පත්‍ර සම්පූර්ණ කිරීමේ දී ටෙන්ඩර්කරුවන් පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් සැලකිලිමත් විය යුතු ය :-

(i) ටෙන්ඩර් පත්‍රය මුළුමනින්ම සම්පූර්ණ කළ යුතු ය. එසේ කිරීමේ දී එහි සඳහන් කර ඇති මුදල ඉලක්කමෙන් පමණක් නොව අකුරින් ද ලිවිය යුතු ය ;

(ii) සම්පූර්ණ කරන ලද ටෙන්ඩර් ආකෘති පත්‍රයේ සාක්ෂිකරුගේ අත්සන යොදා තිබිය යුතු ය ;

(iii) සෑම වෙනස් කිරීමක් හෝ වචන කපා හැරීමක් වෙනුවෙන් ටෙන්ඩර්කරුගේ කෙටි අත්සන හා දිනය යොදා සහතික කර තිබිය යුතු ය.

මෙකී අවශ්‍යතාවයන් ට පටහැනිව ඉදිරිපත් කරන ටෙන්ඩර් පත්‍ර ප්‍රතික්ෂේප කරනු ලැබේ.

04. විධිමත් ලෙස ඉදිරිපත් කරන ලද ටෙන්ඩර් පත්‍රය -

*(අ)* ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට මුදල් ගෙවූ කුවිතාන්සිය,
*(ආ)* වත්කම් සහතිකය.

සමග ලියුම් කවරයක බහා සීල් තබා ලියුම් කවරයෙහි වම් කෙළවරෙහි ඉහළින් තැබෑරුමේ අංකය සහ නම සඳහන් කර දෙල්තොට ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙහි තබා ඇති ටෙන්ඩර් පෙට්ටියේ ටෙන්ඩර් භාර ගැනීම අවසන් වන වේලාවට ප්‍රථම තැන්පත් කළ යුතු ය. එසේ නැතහොත් ටෙන්ඩර් භාර ගැනීමේ වේලාව ඉකුත් වීමට ප්‍රථම දෙල්තොට ප්‍රාදේශීය ලේකම් වෙත ලැබෙන පරිදි ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය.

05. රේන්දය වෙනුවෙන් ටෙන්ඩර් භාර ගැනීම අවසන් කරන වේලාව ඉහත සඳහන් පළමුවැනි ඡේදයේ සඳහන් කර ඇත. එකී වේලාවන්වල දී සියලුම ටෙන්ඩර්කරුවන් දෙල්තොට ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ පෙනී සිටිය යුතු ය.

06. සාර්ථක ලෙස ටෙන්ඩර් ඉදිරිපත් කළ අය වරප්‍රසාද මිල දී ගත් තැනැත්තා වශයෙන් ප්‍රකාශ කරනු ලැබූ පසු ප.ව. 2.30 ට පෙර දෙල්තොට ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ තැන්පත් කර යට කී විදේශ මත්පැන් තැබෑරුම් රේන්ද විකිණීමේ කොන්දේසි මාලාවට අත්සන් තැබිය යුතු ය. මෙම ගෙවීම් මුදලින් හෝ බැංකුවෙන් හෝ ආරක්ෂිත චෙක්පතක් නමැති ස්වරූපයෙන් නිකුත් කරන ලද චෙක්පතක් හෝ බැංකුවකින් ඒ බැංකුවේ නමට නිකුත් කරන ලද චෙක්පතකින් හෝ ගෙවිය යුතු ය.

07. සියලුම මත්පැන් තැබෑරුම්වල හෝ වෙනත් බලපත්‍රලත් ස්ථානවල විකිණීම සඳහා තොග (පීප්ප) අරක්කු නිකුත් නොකරන බව සැළකිය යුතු ය.

08. ආරක්ෂිත හේතුවක් මත හෝ රජය මගින් නිකුත් කරනු ලබන හෝ වෙනත් යම් කරුණක් මත හෝ විදේශ මත්පැන් තැබෑරුම තාවකාලිකව වසා තැබීමට නියෝගයක් නිකුත් කිරීමට මා හට සිදුවුවහොත් එම වසා තබන කාලය තුළ දී රේන්ද වාරික සහන සැලසීමක් කරනු නොලැබේ.

09. මීට පෙර විදේශ මත්පැන් සලක් පවත්වාගෙන යෑම සම්බන්ධයෙන් රජයට යම් මුදලක් ගෙවීමට තිබේනම් ටෙන්ඩරය පිළිගැනීමට ප්‍රථම එම හිඟ මුදල ගෙවා නිම කළ යුතු ය.

10. වැඩි විස්තර මෙම කාර්යාලයෙන් විමසා දැන ගත හැකි ය.

යූ. ජේ. එම්. එස්. එස්. බී. ජයසිංහ,
ප්‍රාදේශීය ලේකම්,
දෙල්තොට.

2016 ජූලි මස 27 වැනි දින,
දෙල්තොට ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

**උපලේඛනය**

***මහනුවර දිස්ත්‍රික්කයේ දෙල්තොට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ අනුමත කළ විදේශ මත්පැන් තැබෑරුම් ලැයිස්තුව - 2016/2017 වර්ෂය***

| *අනුක්‍රමික අංකය හා නම* | *කොට්ඨාසය* | *තැබෑරුම පිහිටුවිය යුතු ස්ථානය* | *තැබෑරුම විවෘත කර තබන කාලය සහ වේලාව* | *ටෙන්ඩර් භාර ගැනීම අවසන් කරන දිනය සහ වේලාව* |
|---|---|---|---|---|
| විදේශ මත්පැන්හල | දෙල්තොට | දෙල්තොට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ | පෙ.ව. 11.00 සිට ප.ව. 2.00 දක්වා සහ ප.ව. 5.00 සිට ප.ව. 8.00 දක්වා | 2016.08.29 වැනි දින පෙ.ව. 10.30 දක්වා |

විදේශ මත්පැන් තැබෑරුම් සඳහා තැන්පත් කළ යුතු මුදල රු. 1,000.00 ක් වේ.

08-421

# වෙන්දේසි කිරීම් පිළිබඳ දැන්වීම්

## නැෂනල් ඩිවලොප්මන්ට් බැංකුව පීඑල්සී

1990 අංක 04 දරන බැංකු විසින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතෙහි 8 වන වගන්තිය යටතේ වටිනා දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

**අංක 18 දරන උකස්කරය යටතේ උකස් කරන ලද දේපළ පිළිබඳ විස්තර**

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, හාපිටිගම් කෝරළේ, උඩගහ පත්තුවේ මීරිගම ප්‍රාදේශීය සභා සීමාවට අයත්, මීරිගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ දංඕවිට ග්‍රාම නිලධාරි වසමේ, දංඕවිට ග්‍රාමයේ පිහිටි ''හුරිගහවත්ත'' ලෙස හැඳින්වෙන (කොටසක්) බලයලත් මිනින්දෝරු ජී. කේ. එන්. තිලකසිරි විසින් සාදන ලද 2014 ජනවාරි මස 17 වැනි දිනැති අංක 1820 දරන පිඹුරේ ලොට් අංක 1 ඒ ලෙස දක්වෙන (බලයලත් මිනින්දෝරු ජේ. ජී. කම්මන්කඩ විසින් සාදන ලද 2008 මැයි 16 වැනි දිනැති අංක 3524 දරන පිඹුරේ ලොට් අංක 1 ලෙස දක්වූ ඉඩමේ නැවත මිනුමකි) සීමා නිර්ණය කර බෙද වෙන්කරන ලද බිම් කට්ටිය.

ඉඩමේ ප්‍රමාණය : අක්. 03, රූඩ් 0, පර්. 21. 1

එහි පිහිටි ගොඩනැගිලි, ගස්වැල්, වගාවන් සහ සියල්ල සහිතව සහ ඉහත කී අංක 1820 දරන පිඹුර දක්වෙන මාර්ගය සඳහා වෙන් කිරීමත් එයට අදාළ අනෙකුත් සියලුම අයිතීන් ද සමග කල්පිටිය පදිංචි පකීර් මොහිඩීන් අබ්දුල් ගෆූර් හෙවත් මොහිදීන් අබ්දුල් ගෆූර් සහ අබ්දුල් ගෆූර් මොහිදීන් අම්මා යන අය (ණයගැතියන්) විසින් 2015 පෙබරවාරි මස 05 වැනි දිනැති අංක 18 දරන උකස්කරය ප්‍රකාර, ණය පහසුකම්වලට යටත් කරන ලදුව නැෂනල් ඩිවලොප්මන්ට් බැංකුව පී එල් සී (බැංකුව) ට උකස් කරන ලදුව, ගෙවීම්වල දී පොරොන්දු නිසියාකාරව ඉෂ්ඨ නොකරන ලද දේපළ සහ පරිශ්‍ර එන් ඩී බී බැංකුව පී එල් සී විසින් අප වෙත පවරන ලද බලය යටතේ අප විසින් 2016 සැප්තැම්බර් මස 08 වැනි දින (බ්‍රහස්පතින්දා) පෙ. ව. 11.00 ට පිහිටි ස්ථානයේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

ගෙවීමේ ක්‍රමය.- මිල තීන්දු වූ වහාම සාර්ථක ගැණුම්කරු විසින් පහත සඳහන් මුළු මුදල් මුදලින් ගෙවිය යුතු ය.

1. ගැණුම් මිලෙන් 25% ක් (සියයට විසිපහක්),
2. ගැණුම් මිලෙන් 11%ක් (සියයට පහළවක්) වැට් බදු,
3. පළාත් අධිකාරියට ගෙවිය යුතු 1% ක (සියයට එකක) විකුණුම් බදු,
4. වෙන්දේසිකරුගේ කොමිස් මුදල 2 1/2% (සියයට දෙකහමාර),
5. සම්පූර්ණ ප්‍රචාරක පිරිවැය,
6. ලිපිකරුගේ හා සෝෂකගේ ගාස්තුව රු. 500,
7. විකුණුම් කොන්දේසි සඳහා නොතාරිස් ගාස්තුව රු. 2,000.

ගැණුම් මිලෙන් 75%ක් වූ ඉතිරිය ද, ශ්‍රී ලංකා ආණ්ඩුව විසින් හෝ වෙනත් අධිකාරියක් විසින් හෝ පනවනු ලබන වෙනත් ව්‍යවස්ථාපිත බදු, තීරු බදු, අය බදු හෝ ගාස්තු අය කිරීම් ද වෙතොත් ඒවා ද සමග වෙන්දේසි දින සිට දින 30ක් ඇතුළත ගෙවිය යුතු වේ.

*දේපළ වෙත පිවිසීම.* - මහනුවර සිට කොළඹ පාරේ කිලෝමීටර් 63.5ක් ගමන් කළ විට පාරට මුහුණලා ඇති අදළ දේපළ වෙත ළඟා විය හැක. (54 බෝක්කුව සහ 54/3 බෝක්කුව අතර පිහිටා ඇත).

වැඩි විස්තර සඳහා කරුණාකර එන් ඩී බී බැංකුව පී එල් සී හි නීති දෙපාර්තමේන්තුව අමතන්න. දුරකථන අංකයඃ 011- 2448448.

''ඉහත වෙන්දේසිය පෙර දැනුම්දීමකින් තොරව නවතා ගැනීමේ/අවලංගු කිරීමේ පූර්ණ අයිතිය බැංකුව සතුයි.''

ෂොක්මන් සහ සමරවික්‍රම,
එකම රටක් එකම වෙන්දේසිකරුවෙක්,
වසර 124 ක සේවා විශිෂ්ඨත්වය සමගින්.

*ප්‍රධාන කාර්යාලය :*
අංක 24, ටොරින්ටන් පාර,
මහනුවර.
දුරකථන අංකය : 081 - 2227593
දුරකථන/ෆැක්ස් අංකය : 081-2224371
ඊමේල් : schokmankandy@sltnet.lk

*නගර කාර්යාලය හා ප්‍රදර්ශනාගාරය :*
අංක 290, හැව්ලොක් පාර,
කොළඹ 05.
දුරකථන අංක : 011-2502680, 2585408
දුරකථන/ෆැක්ස් අංකය : 011- 2588176
ඊමේල් : schokman@samera1892.com

වෙබ් අඩවිය : www.sandslanka.com

08-434

**කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. (නගර ශාඛාව)**

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. (ලියාපදිංචි අංක පී කිව් 116) මගින් මා වෙත පවරා ඇති බලය ප්‍රකාර ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, කොළඹ මහනගර සභා සීමාව තුළ හුණුපිටිය කොට්ඨාස අංක 23 හි පිහිටි යුනියන් පෙදෙසේ වරිපනම් අංක 115, 117 සහ 119 දරන නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු එන්. අබයසිරි විසින් 2001 ජනවාරි මස 09 වැනි දින සාදන ලද අංක 2001/03 දරන පිඹුරෙන් බෙද වෙන් කරන ලද ලොට් 1.

*ප්‍රමාණය :*පර්චස් හතයි දශම හතයි එක (අ. 0, රූ. 0, පර්. 7.71) ඉඩම සමග ගොඩනැගිලි සහ එහි පිහිටි සියලුදේත් සමග වේ.

රත්මලාන, බොරුපන ෆෙරී පාරේ, අංක 40 දරන ස්ථානයේ ලියාපදිංචි කාර්යාලය පිහිටි ශ්‍රී ලංකාව තුළ නීත්‍යානුකූල සමාගමක් වශයෙන් ස්ථාපිත ද ට්‍රේඩ්ස්මන් එස්එල් (ප්‍රයිවට්) ලිමිටඩ් කලින් හැඳින්වුන ස්ටීල්ෆීඩ්ස් ට්‍රේඩින් (ප්‍රයිවට්) ලිමිටඩ් ණයකරු ලෙස කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. හට උකස් කරන ලද ඉහත උපලේඛනයේ සඳහන් දේපළ වර්ෂ 2016ක් වූ සැප්තැම්බර් මස 06 වැනි දින පෙ. ව. 10.30 ට ඉහත ස්ථානයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

යෝජනා සම්මුතිය සඳහා 2016.08.12 වැනි දින *රජයේ ගැසට් පත්‍රය* ද, ලක්බිම, ද අයිලන්ඩ් සහ වීරකේසරී පුවත්පත් සහ 2016.08.26 දින *රජයේ ගැසට් පත්‍රය* ද බලන්න. විකිණීම පිළිබඳ දැන්වීම සඳහා 2016.08.19 වැනි දින ලක්බිම, ද අයිලන්ඩ් සහ වීරකේසරී පුවත්පත් ද බලන්න.

*ඉඩමට පිවිසීම.* - කොම්පඤ්ඤ වීදියේ සිට දෙස්තර කොල්වින් ආර් ද සිල්වා මාවත ඔස්සේ මීටර් 250ක් පමණ ගමන් කළ විට අදළ දේපළ වම්පසින් පිහිටා ඇත.

*ගෙවීමේ ක්‍රමය.*- විකිණීම ස්ථිර කළ වහාම ගැණුම්කරු විසින් පහත සඳහන් ගෙවීම් වෙන්දේසිකරු වෙත මුදලින් ගෙවිය යුතු ය.

(1) ගැණුම් මිලෙන් සියයට දහයක් (10%) (2) පළාත් සහා අයබදු සඳහා සියයට එකයි (1%), (3) වෙන්දේසිකරුගේ කොමිස් මුදල් විකුණුම් මිලෙන් සියයට දෙකයි දශම පහයි (2.5%), (4) නොතාරිස් ගාස්තුව රු. 2,000, (5) ලිපිකරු හා සෝෂක වේතනය රු. 500, (6) වෙන්දේසිය සඳහා වැය කරන ලද සියලුම ප්‍රචාරක වියදම්, (7) ගැණුම්කරු විසින් අකාලීන වටිනාකම් බද්ද (VAT) ගෙවිය යුතු යි. (8) ගැණුම් මිලෙන් ඉතිරි සියයට අනුව (90%) විකිණීමේ දින සිට දින 30ක් තුළ දී කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. හි ප්‍රධාන කාර්යාලයේ හෝ නගර ශාඛාවේ තැන්පත් කළ යුතු ය.

හිමිකම් ඔප්පු පරීක්ෂා කිරීම සහ වැඩි විස්තර සඳහා පහත සඳහන් අයගෙන් විමසන්න :-

එල්. බී. සේනානායක,
සාම විනිසුරු, බලයලත් ජ්‍යෙෂ්ඨ වෙන්දේසිකරු,
තක්සේරුකරු, උසාවි කොමසාරිස්.

අංක 200, 2 වැනි මහල, උසාවි පාර,
කොළඹ 12.
දුරකථන/ෆැක්ස් අංකය : 011 - 2445393
ඊමේල් : senaservice@sltnet.lk

ප්‍රධාන කළමණාකරු (ණය අයකර ගැනීම්)
කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී.
අංක 21,
ශ්‍රීමත් රාසික් ෆරීඩ් මාවත,
කොළඹ 01.
දුරකථන අංක : 011- 2486766
ෆැක්ස් අංකය : 011- 2347717.

08-530

---

**පෑන් ඒෂියා බැංකින් කෝපරේෂන් පී. එල්. සී.**

**1990 අංක 4 දරන බැංකු විසින් ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 9 වැනි වගන්තිය යටතේ පවත්වනු ලබන ප්‍රසිද්ධ දේපළ වෙන්දේසිය**

බැංකුවෙන් මා වෙත පවරා ඇති බලතල අනුව පහත දක්වෙන දේපළ පහත දක්වෙන දිනයේ දී එකී දේපළ පිහිටි ස්ථානයේ දී එහි දක්වා ඇති වේලාවේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, මීගමුව ලියාපදිංචි කිරීමේ කොට්ඨාසයේ, අලුත්කුරු කෝරළේ, දාසියා පත්තුවේ, කටුනායක - සීදූව නගර සභා සීමාව තුළ, කටාන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ කටුනායක - දකුණ අංක 143 ඒ ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, කටුනායක ග්‍රාමයේ පිහිටා ඇති, ''දවටගහවත්ත කොටස'' සහ ''දවටගහවත්ත'' නමැති ඉඩමට බලයලත් මානක පී. ඩී. එන්. පීරිස් විසින් මැන සාදන ලද වර්ෂ 1995.06.25, 2012.03.02 සහ 2015.07.18 දිනැති අංක 726 AA දරන පිඹුර ප්‍රකාරව ලොට් A වශයෙන් බෙදා වෙන් කරන ලද ඉඩම් කොටස සහ ඒ මත පිහිටි ගොඩනැගිල්ල සහ අනෙකුත් සෑම සියලු දේත් සමග වේ.

(බිම් ප්‍රමාණය අ. 0, රූ. 1, පර්. 7.75)
වර්ෂ 2016 ක් වූ සැප්තැම්බර් මස 09 වැනි දින පෙ. ව. 11.30ට

*දේපළට පිවිසෙන මාර්ගය* .- කොළඹ කොටුවේ සිට, කොළඹ සිට මහනුවර දක්වා වන "A1" ප්‍රධාන පාරේ ගමන් කර කැලණිය පාළම පසුකළ පසු වම් පැත්තට පෑලියගොඩ සිට පුත්තලම දක්වා වන A3 ප්‍රධාන පාර පිහිටා ඇත. එම A3 ප්‍රධාන පාරේ ගමන් කර කි. මී. 24 කණුව පසු කළ වහාම දකුණු පැත්තට නුගගහ පාර (සරත් මාවත) පිහිටා ඇත. එම නුගගහ පාරේ මීටර් 300ක් පමණ පසු කළ පසු දකුණු අත පැත්තේ විෂයගත දේපළ පිහිටා ඇත. එම දේපළ ආසන්න වශයෙන් මීගමුව නගරයට කි. මී. 7.8ක් පමණ පෙරාතුව සහ කොළඹ කොටුවේ සිට කි. මී. 29.6ක් පමණ දුරකින් පිහිටා ඇත.

ශ්‍රී මායා ට්‍රේඩිං (ප්‍රයිවට්) ලිමිටඩ් බන්ධනදායි, වශයෙන් ද, කැටවලගේ අජිත් ප්‍රේමකීර්ති ද විජේසිංහ උකස්කරු, වශයෙන් ද, කලින් පෑන් ඒෂියා බෑන්කිං කෝපරේෂන් ලිමිටඩ් සහ පෑන් ඒෂියා බැන්ක් ලිමිටඩ් යනුවෙන් හැඳින්වුන ලියාපදිංචි අංක පී. කිව්. 48 දරන පෑන් ඒෂියා බෑන්කිං කෝපරේෂන් පීඑල්සී නමට ප්‍රසිද්ධ නොතාරිස් සී. දයාරත්න විසින් ලියා සහතික කරන ලද වර්ෂ 2015.09.25 දිනැති අංක 10121 දරන ප්‍රාථමික උකස් බැඳුම්කරය මත ලැබිය යුතු මුදල් ගෙවීම පැහැර හැර ඇති හෙයින් ද,

යෝජනා සම්මුතිය පිළිබඳ නිවේදනය වර්ෂ 2016.08.05 වැනි දින ඩෙයිලි නිවුස්, ලක්බිම, සුඩර් ඔලි පුවත්පත් සහ එදින ගැසට් පත ද බලන්න.

*ගෙවීමේ ක්‍රමය*. - වෙන්දේසිය අවසාන වූ විගස ගැණුම්කරු එවෙලේ ම පහත සඳහන් මුදල් වෙන්දේසිකරුට ගෙවිය යුතු ය.

(1) ගැණුම් මුදලේ 10% ද (සියයට දහයක්),
(2) පළාත් පාලන ආයතන ගාස්තු වශයෙන් 1% ද (සියයට එකයි) සහ වැට් බද්ද ද,
(3) වෙන්දේසිකරුගේ කොමිස් මුදල වශයෙන් විකුණුම් මිලෙන් 2 1/2% ද, (සියයට දෙක හමාරක්)
(4) ප්‍රචාරක වියදම් ද,
(5) විකුණුම් කොන්දේසි සඳහා නොතාරිස් ගාස්තු ද,
(6) ලිපිකරු හා සෝෂකගේ ගාස්තුව රු. 1,500 ද.

වෙන්දේසි දිනයේ සිට වැඩ කරන දින 30ක් ඇතුළත ගැණුම් මිලේ පරිශේෂය වන 90% ක මුදල බැංකුවට ගෙවිය යුතු ය. එකී 90% ඉතිරි මුදල දින 30 ක් ඇතුළත දී නොගෙව්වහොත් ගෙවා ඇති 10% ක මුදල අහිමි කිරීමට හා එකී දේපළ නැවත විකිණීමට බැංකුවට අයිතිය ඇත.

අදාළ ඔප්පු හා අනෙකුත් ලියවිලි පරීක්ෂා කිරීම සහ වෙනත් අදාළ තොරතුරු කළමණාකරු - ණය අයකර ගැනීම් අංශය, පෑන් ඒෂියා බැංකින් කෝපරේෂන් පී. එල්. සී. ප්‍රධාන කාර්යාලය, අංක 450, ගාලු පාර, කොළඹ 03.

දුරකථන අංක : 011- 4667130/011-4667237/011-4667229.

තුසිත් කරුණාරත්න,
උසාවි කොමසාරිස් සහ බලයලත් වෙන්දේසිකරු.

අංක : 182/3(50/3), විහාර මාවත, කොලොන්නාව
දුරකථන : 011 3068184 ෆැක්ස් අංකය : 011- 2572940.

08-538

## හැටන් නැෂනල් බැංකුව - නුගේගොඩ ශාඛාව

### 1990 අංක 04 දරන පනත මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ පනතේ 04 වන වගන්තිය යටතේ විකුණුම් දැන්වීම

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ සල්පිටි කෝරළේ පල්ලෙ පත්තුවේ ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ මහනගර සභා සීමාවේ ආනන්ද බාලිකා මාවතේ අංක 60/30 හි ජයසිංහ ගාඩින්ස් (කලින් එගොඩ පොතුවල කුඹුර) නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු එම්. එල්. එන්. පෙරේරා විසින් 1999.04.08 වැනි දින ලද අංක 967, දරන පිඹුරෙන් බෙදා වෙන් කරන ලද ලොට් බී නම් ඉඩම් කොටසෙන් නිරූපණය කරන ගොඩනැගිලි සහ අනෙකුත් සියලු දේ ද සමග ඉඩම.

ප්‍රමාණයෙන් පර්චස් නමයක් (අ. 0 රූ. 0 පර්. 09) විශාල ඉඩම

හැටන් නැෂනල් බැංකුව පී. එල්. සී. වෙතින් මා වෙත පවරන ලද බලය වන මා විසින් 2016.09.09 වැනි දින පෙ. ව. 11.30ට දේපළ පිහිටි ස්ථානයේදී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

*වැඩි විස්තර සඳහා.* - රජයේ ගැසට් පත්‍රයේ ද, 2011.09.23 වැනි දින ලක්බිම, ඩේයිලි මිරර් සහ තිනකරන් පුවත්පත්වල පළකර ඇති වෙන්දේසි යෝජනා දැන්වීමට අවධානය යොමු කරන්න.

*දේපළට පිවිසීම.* - කොළඹ කොටුවේ සිට ගමන් කරන විට නුගේගොඩ කඩමණ්ඩිය තෙක් ගොස් පාගොඩ පාරේ ආනන්ද බාලිකා මාවත තෙක් ගොස් ආනන්ද බාලිකා මාවතේ මීටර් 200ක් දුර යන්න. මෙම දේපළ මෙම පාරේ කෙළවරේ පිහිටා ඇත.

*ගෙවීමේ ක්‍රමය.* - වෙන්දේසිය අවසානයේ සාර්ථක ගැණුම්කරු විසින් පහත සඳහන් මුදලින් ගෙවීම කළ යුතු ය.

1. ගැණුම් මිලෙන් 10%ක් ද,
2. ප්‍රාදේශීය සභා බදු 1%ක් ද,
3. වෙන්දේසිකරුගේ කොමිස් වශයෙන් විකුණුම් මිලෙන් 2 1/2%ක් ද,
4. ලිපිකරු හා නිවේදකගේ ගාස්තු වශයෙන් රු. 500ක් ද,
5. නොතාරිස් ගාස්තු හා විකිණීමේ කොන්දේසි සහතික කිරීම සඳහා රු. 2,000ක් ද,

ගැණුම් මිලෙන් 90%ක් වූ මුදල විකුණුම් දින සිට දින 30ක් ඇතුළත හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී වෙත ගෙවා නිමකළ යුතු ය.

ප්‍රධාන කළමනාකරු (අය කිරීමේ අංශය) හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී, අංක 179 ටී. බී. ජයා මාවත, කොළඹ 10.

දුරකථන අංක : 011-2661821, 011- 2661835.

හිමිකම් ඔප්පුව සහ වෙනත් අදළ විස්තර ඉහත ලිපිනයෙන් ලබාගත හැක.

ඉහත සඳහන් කරන ලද මුදල් දින තිහක් (30)ක් ඇතුළත නොගෙවුවහොත් දැනටමත් ගෙවා ඇති ගැණුම් මුදලෙන් 10% ක මුදල ආපසු නොගෙවීමට සහ නැවත දේපළ විකිණීමට බැංකුවට අයිතියක් ඇත.

ඉහත වෙන්දේසිය පෙර දැනුම්දීමකින් තොරව නවතා ගැනීමේ අවලංගු කිරීමේ පූර්ණ අයිතිය බැංකුව සතු ය.

ඊ. එස්. රාමනායක,
උසාවි කොමසාරිස්,
බලයලත් වෙන්දේසිකරු සහ
තක්සේරුකරු සාමවිනිසුරු (මුළු දිවයිනටම)

අංක 11/55, බෝගහවත්ත,
කුඩාබුත්ගමුව, අංගොඩ
දුරකථන අංක 0112 419126, 011- 4280136
0723 3836742, 072 3207533.

08-549

---

## මහජන බැංකුව - ස්ටැන්ලි වීදිය ශාඛාව - යාපනය

### 1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 දරන මහජන බැංකු පනතේ 29 ඩී වගන්තිය යටතේ කෙරෙන වෙන්දේසි කිරීම

වවුනියාව වෙන්කලචෙට්ටිකුලම් පූවරසන්කුලම් චෙට්ටිකුලම් පාරේ අක්කර 02යි, රූඩ් 0 යි, පර්චස් 00.09 ක (හෙක්ටයාර 0.8096) විශාලත්වයෙන් යුතු ඉඩම හා එහි ඇති විශාල ගොඩනැගිල්ල රොඩ්මන් ඉලක්ට්‍රෝඩ්ස් ආයතනය මගින් මහජන බැංකුවට උකස් කර බේරා නොගත් දේපළ මහජන බැංකුව මගින් මා හට ලබාදී ඇති බලතල අනුව 2016 වසරේ සැප්තැම්බර් මස 03 වැනි සෙනසුරාදා දින පෙ. ව. 11.00 සිට එම ස්ථානයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

*දේපළ පිහිටා ඇති ස්ථානයට යන මාර්ගය .*- වවුනියාව නගරයේ කච්චේරි හන්දියේ සිට මන්නාරම පාරේ පැමිණෙන විට 14 වන කිලෝමීටරය අසල පූවරසන්කුලම් හන්දිය ඇත. එහි සිට සෙට්ටිකුලම් පාරේ කි. මී. 2ක් පැමිණෙන විට එරුකලංකල් හන්දිය හමුවේ. එම මාර්ගයේ දකුණුපස දේපළ පිහිටා ඇත. රාජ්‍ය හා පෞද්ගලික බස් ගමනාගමන පහසුකම් තිබේ.

*දේපළ පිළිබඳ විස්තර.*- වවුනියා දිස්ත්‍රික්කයේ, වෙන්කලචෙට්ටිකුලම් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ චෙට්ටිකුලම් ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ කුරුකල්පුදුකුලම් ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ මනියාර්කුලම් හි පිහිටි "මනියාර්කුලතුකාඩු" යනුවෙන්

සඳහන් කැබලි ඉඩම. විශාලත්වය අක්කර දෙකයි රූඩ් බින්දුවයි පර්චස් දශම බින්දුවයි නවයයි (අක්. 02 රූඩ් 0 පර්චස් 09)

මෙය බලයලත් මිනින්දෝරු එම්. සී. මොහමඩ් රෆීක් විසින් 2012.07.02 වැනි දින මැන සාදන ලද අංක 3763 දරන පිඹුරේ දැක්වෙන ඉඩම.

මේ සමග වර්ග අඩි 10976ක් විශාල ගොඩනැගිල්ල අඩි 100ක් ගැඹුරු නළ ළිඳ හා සිමෙන්තිවලින් සාදන ලද ළිඳ කර්මාන්ත ශාලාවේ යන්ත්‍රෝපකරණ වෙන්දේසියට ඇතුළත් නොවේ.

මෙම යෝජනා දැන්වීම සඳහා 2015 දෙසැම්බර් මස 18 වැනි දින *රජයේ ගැසට් නිවේදනය* 2015 දෙසැම්බර් මස 07 වැනි දින තිනකරන් පුවත්පත හා 2015 දෙසැම්බර් මස 04 වැනි දින ඩේලි නිවුස්, දිනමිණ පුවත්පත් බලන්න.

*ගෙවීම් කරන ආකාරය.* -

වෙන්දේසියේ ජය ගනු ලබන ගැණුම්කරු වෙන්දේසිය අවසානයේ පහත සඳහන් ආකාරයට මුදල් ගෙවිය යුතු ය.

1. ගැණුම් මිලෙන් 10% (සියයට දහයක්),
2. පළාත් පාලන ආයතනවලට ගෙවිය යුතු බදුපනම් 1% (සියයට එකක්)
3. විකුණුම් මිලෙන් වෙන්දේසිකරුගේ කොමිස් මුදල් 2.5% (සියයට දෙකහමාරක්),
4. ලිපිකරු සහ වෙන්දේසි කරන්නාගේ ගාස්තු රු. 1,000,
5. විකුණුම් වියදම් සහ අනෙකුත් ගාස්තු ඇත්නම් ඒවාත්,
6. විකුණුම් සහතික මුද්දර ගාස්තු ආදිය සඳහා වූ ගාස්තු.

ගැණුම් මිලෙන් ඉතිරි 90% (සියයට අනූව) විකිණීමෙන් පසු දින 30ක් ඇතුළත යාපනය/වවුනියාව මහජන බැංකු ප්‍රාදේශීය ප්‍රධාන කාර්යාලයේ ගෙවිය යුතුයි. යාපනය දුරකථන අංකය 021- 2222601, 2223836 වවුනියාව 024 - 2222972, 2225054 ඉඩමේ ඔප්පුවේ පිටපත් සහ අනෙකුත් විස්තර ඉහත ලිපිනයෙන් ලබාගත හැකියි.

එසේ කිරීමට අපොහොසත් වුවහොත් කලින් ගෙවන ලද සියයට දහයක මුදල (10%) රාජසන්තක කිරීමටත් දේපළ යලි විකිණීමටත් බැංකුවට අයිතිය ඇත.

කේ. පී. බාලක්‍රිෂ්ණන්,
අධිකරණ කොමසාරිස්,
බලයලත් වෙන්දේසිකරු,

අංක 692, කේ. කේ. එස්. වීදිය,
යාපනය.
දුරකථන අංක 021 - 2222940, 076 6035221.

08-579

## ලංකා බැංකුව

### 1968 අංක 34 දරන පනතින් හා 1974 අංක 10 දරන නීතියෙන් සංශෝධනය කරන ලද ලංකා බැංකු ආඥා පනතේ (397 අධිකාරය) 22 වගන්තිය යටතේ විකිණීම පිළිබඳ දැන්වීම

ණය යොමු අංක : 77055364

කිරිඇල්ල, හිඳුරන්ගල, අංක 44 හි ගොඩේ පතිරන්නැහෙලාගේ ඉන්දික කුමාර පතිරණ මහතා සහ පුයියප්පු ආරච්චිගේ වත්සලා ප්‍රබෝධනී මහත්මිය යන අයට අයත් උකස් කරන ලද දේපළ විකිණීම.

ලංකා බැංකු ආඥාපනතේ 19 වැනි වගන්තිය යටතේ සම්මත කරනු ලැබූ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 2016.06.24 දිනැති අංක 1973 දරන *ගැසට් පත්‍රයේ* හා 2016 ජුනි මස 20 වැනි සඳුදා දින ''දිනමිණ'', ''ඩේලි නිවුස්'' හා ''තිනකරන්'' යන පුවත්පත් වල පළ කරන ලද ලංකා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ යෝජනා සම්මුතියකට අනුකූලව මුල් ණය මුදලේ ශේෂය ද, විකිණීම කෙරෙන දිනය තෙක් ඒ මත අයවිය යුතු පොලිය ද, ලංකා බැංකු ආඥාපනතේ අංක 26 වන වගන්තිය යටතේ අයකර ගත හැකි ගාස්තු හා මුදල් ද අයකර ගැනීම පිණිස මෙහි පහත උපලේඛනයේ විස්තර කොට ඇති දේපළ සහ පරිශ්‍ර එකී ස්ථානයේ දී ම 2016 ඔක්තෝබර් මස 20 වැනි බ්‍රහස්පතින්ද දින පෙ. ව. 11.00 ට, මහනුවර ටොරින්ටන් පාරේ, අංක 24 හි වෙන්දේසිකාර ෂොක්මන් සහ සමරවික්‍රම මහතා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දන්වා සිටිමු.

#### *උපලේඛනය*

සබරගමු පළාතේ, රත්නපුර දිස්ත්‍රික්කයේ, කුරුවිටි කෝරළේ, පල්ලෙපත්තුවේ, ඇහැලියගොඩ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ හිඳුරන්ගල ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ හිඳුරන්ගල ග්‍රාමයෙහි පිහිටි ''දිගනෙගොඩැල්ලවත්ත'' නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු එස්. රාමක්‍රිෂ්ණන් විසින් සාදන ලද 2006.10.20 දිනැති අංක 2412/06 දරන පිඹුරෙහි ලොට් 1 ලෙස දක්වා සීමා නිර්ණය කොට නිරූපණය කර ඇති බෙදූ ඉඩම් කැබැල්ල උතුරට : F. V. P. 256 හි ලොට් 385 සහ ඇහැලියගොඩ සිට ඉඩංගොඩ දක්වා ප්‍රධාන පාර ද, නැගෙනහිරට : ඇහැලියගොඩ සිට ඉඩංගොඩ දක්වා ප්‍රධාන පාර ද, දකුණට : එකී අංක 2412/06 දරන පිඹුරෙහි ලොට් 02 සහ F. V. P. 56 හි ලොට් 382 ද, බස්නාහිරට : F. V. P. 56 හි ලොට් 382 සහ F. V. P.56 හි ලොට් 385 (F. V. P. 56 හි ලොට් 382 සහ F. V. P. 256 හි ලොට් 385 ලෙස ලියාපදිංචි) ද මායිම්ව රූඩ් එකයි පර්චස් විස්සක (අ. 0 රූ. 1 පර්. 20) හෙවත් හෙක්ටයාර් බිංදුවයි දශම බිංදුවයි පහයි බිංදුවක (හෙක්. 0.050) බිම් ප්‍රමාණයකින් යුක්ත වන අතර එහි ඇති වෙනත් සියලු දේ ද වේ. මෙය අවිස්සාවේල්ල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ V 179/220 හි ලියාපදිංචි කර ඇත.

ලංකා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

ජේ. ඩී. බී. ඩබ්. ජයකොඩි මහතා,
කළමනාකරු.

ලංකා බැංකුව,
අයගම.

08-531

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.